**නව ශාක අංකුර බිහි වී ලියලා වැඩේවා !**

‘දහම් නවෝදය’
මෙම ප්‍රකාශන අධ්‍යයනයේ දී
අපගේ 4වන ප්‍රකාශනය,
‘ශුද්ධාත්ම පිය සටහන්’
අංක **12** සිට ප්‍රකාශනය අග දක්වා
අධ්‍යයනය කරමින්
ජේසු සමිඳුන්ගේ අනාවරණයන් හා
එතුමන්ගේ ක්‍රියාවන් අධ්‍යයනය සඳහා
**පළමු** තැන දෙන්න, ප්‍රමුඛතාවය දෙන්න.

"කේන්ද්‍රයෙන් විසුරුණු සියල්ල ව්‍යාකුල වී ඇත. ලොව පුරා රජයන්නේ අරාජික භාවය යි. රුධිර ගලනය ඉතා සුලබ දසුනකි. අහිංසකත්වය දිය යට ගිල්වා මරා දමා ඇත. උදාරවන්තයෝ පරාජිත ස්වරූපයෙන් පලා යද්දී අධමයෝ ඉමහත් උද්‍යෝගයෙන් ක්‍රියාත්මක වී සිටිති."

(W. B. යේට්ස්)

—— * * ——

"මානව පුත්‍රය, මේ ශෛලමය නටබුන් අතරින් නව ශාක අංකුර බිහි වී ලියලා වැඩෙති යි ඔබට අනුමාන කළ හැකි ද?"

(The Waste Land –T.S. එලියට්)

—— * * ——

"අද ලොව පවතින අසහනය හා ව්‍යාකුලත්වය ගැන පමණක් ම අපි සිතමු නම්, අපට කිසි බලාපොරොත්තුවක් ඇතිකරගත නොහැක. එය සම්පූර්ණ යථාර්ථය ද නො වේ. අපි අපේ දයාබර දෙවි පියාණන්ගේ ආදරය කරුණාව හා දයාව කෙරෙහි විශ්වාසය තබමු."

(2 වැනි ජුවාම් පාවුලු පාප් තුමා)

—— * * ——

# නව ශාක අංකුර බිහි වී ලියලා වැඩේවා !

## මෙය ලොව පුරා ප්‍රකාශ කිරීමට ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙන ආදරයේ පණිවුඩයකි.

"ලොව පුරා මාගේ නාමයට ඉතා ආදරයෙන් ක්‍රියා කරමින් සභාවේ ඉදිරි ගමන් මඟ දෙවි පියාට අවනත වීමට ඇති අවංක ආශාවෙන් ක්‍රියාත්මක වන්නා වූ සෑම සංඝයකට ම නුඹලාගේ මෙම ප්‍රකාශන යොමු කරපන්න. ඔවුහු එය වඩවඩාත් ලෝකයේ ගැළවීම සඳහා බෙදා හරින්නට මඟ බලා සිටින්නෝ වෙති. මන්ද, මාගේ වචනය මාගේ පණිවුඩය ඔවුහු සොයමින් ලත වන්නෝය. **මෙය මාගේ ශුද්ධාත්මානුභාවය තුළ ලියැවෙන්නා වූ ද ප්‍රකාශ වන්නා වූ ද දෙයක් බැවින් මේ කිසිවක් කිසි විටෙක අකුරකින් හෝ වචනයකින් හෝ වෙනස් කරන්නට ඉඩ නොතබන්න.** මාගේ අසරණ බැටළුවන් ආරක්ෂා කිරීම උදෙසා ඔබ එය ඉතා ළහිලහියේ සූදානම් කර බෙදා හැරපන්න." (1999.07.01)

**(එනිසා ඔබට අවසර ඇත, ජේසු සමිඳුන්ගේ ඉහත සඳහන් උපදෙස් පිළිපදිමින් මෙය ලොව පුරා ඕනෑ ම භාෂාවකින් මුද්‍රණය කර බෙදා හරින්නට.)**

(මෙම ප්‍රකාශනය ඕනෑ ම ආගමක් අදහන හෝ කිසි ම ආගමක් නොඅදහන ලෝ වැසි සියල්ලන් උදෙසා ය. මෙය ලිය වී ඇත්තේ කිතු දහමට හුරු බසකිනි. සියලු බලැති දෙවියන් වහන්සේ හෙවත් මැවුම්කරුවාණෝ හෙවත් ධර්මයාණෝ ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩියහ. මුළු මිනිස් සංහතියේ පාපය තමන් කෙරෙහි ගෙන තම උත්තම පූජක දිවි පිදීමෙන් විමුක්තිය උදා කරමින් මරණය ජය ගෙන ප්‍රතාපවත් වූ ජේසු සමිඳාණෝ ජීවමාන ව සදාතනික ව වැඩවසති. දෙවියන් වහන්සේ, මැවුම්කරුවාණෝ, ධර්මයාණෝ, ධම්ම යන ඕනෑ ම ඇමතුමකින් ඔබ ඕනෑ ම කෙනකුට මෙම ප්‍රකාශනය හා එක් විය හැකිය.)

"පේදුරු තුමාගේ මහා දේශනයේ ජොවෙල් දිවැසිවරයාගේ දිවැස් වැකිය ඉටු වන මොහොත දැන් පැමිණ ඇතැ"යි ජේසු සමිඳාණෝ ප්‍රකාශ කරති. "**දෙවියන් වහන්සේ මෙසේ වදාරන සේක. අන්තිම දවස්වල දී සකල මනුෂ්‍යයන් හට මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරමි. එවිට ඔබේ දූ පුත්තු දිවැස් වැකි කියති. ඔබේ තරුණයෝ දර්ශන දකිති.**

**ඔබේ මහල්ලෝ ද පැතුම් පතති. එපමණක් නො ව මාගේ දැසි දසුන්ට වුව ද මාගේ ආත්මානුභාවය ප්‍රදානය කරන්නෙමි. ඔවුහු ද දිවැස් වැකි පවසති. තවද, ඉහළ අහසේ අරුම පුදුම දේ ද පහත පොළොවේ ලකුණු ද දක්වා ලමි. ලේ ද ගිනි ද දුම් වලා පටල ද ඇති වේ.**'' (**ශුද්ධ බයිබලය - ක්‍රියා 2:17-19**)

ශුද්ධාත්මානුභාවය විසින් තෝරා ගෙන සකසා ගෙන පත්කර ගෙන ඇති මෙම සංඝය, ''මාගේ උත්තරීතර සංඝය'' යනුවෙන් අමතමින් එහි දාස දාසින් තුළින් ජේසු සමිඳාණෝ මෙසේ ප්‍රකාශ කළහ.

1999. 06. 26 වන දින

''මාගේ දරුවෙනි, මම මහත් සේ සතුටට පත් වන්නෙමි. මක්නිසාදයත් මාගේ දියණියන් තුළින් ද මාගේ පුතණුවන් තුළින් ද මා කළ ක්‍රියා ලෝකයට විහිළුවක් ලෙස පෙනුනත් එය මාගේ ම හස්තය විසින් කළ දෙයක් බව දැන් ලෝකයට අවබෝධ වන මොහොත පැමිණ ඇති බැවිනි. මම මෙලෙස මාගේ සංඝයේ වැඩ දැන් අරඹා ඇත්තෙමි. මා තෝරා පත්කර ගත් සංඝය තුළ නුඹලාට පැවරෙන දූත මෙහෙය තුළ නුඹලාගේ ගමනාන්තයේ අවසාන අදියරේ දී නුඹලා සිටිය යුතු ආකාරය ගැන ද නුඹලාගේ ජීවිත තිබිය යුතු ස්ථානයන් ගැන ද මම නුඹලා ව අද සවස් භාගයේ දී ඉතා ප්‍රඥාවෙන් පූර්ණ කළෙමි. මා තෝරාගත් තැනැත්තා තුළින් නික්මුණු ඒ ඉගැන්වීම ශුද්ධාත්මානුභාවයෙන් ම සිදු වූවක් බවට මම සහතික කරමි. මාගේ කැමැත්තට ඉඩ දෙන, අවනත වන තවත් එකකු වේ ද ඔහුත් උදෙසා අද සවස ලැබුන ඒ ඉගැන්වීම ඒකරාශි කර සම්පිණ්ඩණය කර ඒ සියල්ල ප්‍රකාශනයක් ලෙස ලෝකය පුරා බෙදා හැරීමට ඔබට මගෙන් අවසර ඇත්තේය.

ලක් කිතුනු සභාවත් ලෝක ශුද්ධ වූ සභාවත් වසර 2000 දී ජයන්තිය සමරන්නට මාගේ උපන් දින ප්‍රීතියක් පවත්වන්නට වැරදි අඩිතාලමක වැරදි ගමන් මාර්ගයක යෙදෙන බව ඔවුන්ට වැටහෙන්නට මේ ප්‍රකාශනය නිසැක ව ම ඔවුන්ට මාගෙන් ම ලැබෙන මාගේ ම පිළිතුර බව වැටහෙනු ඇත. කෑමෙන් බීමෙන් වල්මත් වෙමින් ව්‍යාජ ලෙස මාගේ නාමය පාවිච්චි කරමින් මාගේ නාමය විකුණාගෙන ජීවත් වන්නන්ට එය පවත්වන්නටත් එහි නියැලෙන්නටත් කිසිම අවකාශයක් මා තුළ ඔවුන්ට ලැබී නොමැත. මාගේ ජන්ම ජයන්තියේ දී ''මහා ආමෙන්'' කියන්නට නම් මෙම ප්‍රකාශනය තුළින් පෙන්වන ජීවිත මඟට ඔබ ද පිවිසිය යුතුය. අද ඔබ මධ්‍යයේ ප්‍රකාශ වූ මෙම මහා ප්‍රකාශනය නිරන්තරයෙන් ලොව තුළ රැව් පිළිරැව් දීමේ කාලය පැමිණ ඇත.

නුඹලා තුළ මා කෙරෙහි විශ්වාසයක් ඇද්ද මගේ ආත්මානුභාවය ඔබ තුළ ක්‍රියා කරයි ද, ඔබ මාගේ නාමයට අවනත ද යන පදනම තුළ නුඹලා ධර්මිෂ්ඨයන් බව ඔවුන්ට වැටහෙනු ඇත. එලෙස මා තෝරාගත් සංඝය මාගේ සභාව වියවුල් කරන්නට වත්, සභාව විවේචනය කරන්නට වත්, තවත් සභාවක් නිර්මාණය කරන්නට වත් ක්‍රියා කරන පිරිසක් නොව ජේසුස් ක්‍රිස්තුස් වන මා දැමූ අත්තිවාරම ගොඩගන්නට පමණක් නුඹලා ක්‍රියා කරන බව සැමට වැටහෙනු ඇත. ඔබ මනුෂ්‍යයන් පමණක් බැවින් ඔබට නොහැකියි, මුළුමනින් මට අවනත වන්නට. එහෙත් ඔබ තුළ මා ජීවත් වන බැවින්, ඒ සත්‍යය ඔබ අදහන බැවින් ඔබට එය ඉතා පහසු දෙයක් වනු ඇත.''

**1999 ඔක්තෝබර් 10 වන දින**

''ධර්මිෂ්ඨයෙක් වීමට මගේ මිතුරෙක් මගේ ගෝලයෙක් වීමට අවශ්‍ය කරුණු සියල්ල ගොනුකර ලෝකය පුරා පුකාශ කිරීමේ මොහොත දැන් පැමිණ ඇත. මක්නිසාද, එමගින් දැනට නිදිබර ව සිටින, නිදාගෙන සිටින, නොසැලකිල්ලෙන් සිටින සියලුම සභාවන් ධර්මිෂ්ඨ භාවය ගැන සොයන්නටත් එහි ජීවත් වන්නටත් ඒ තුළ ක්‍රියාත්මක වන්නටත් කාලය පැමිණ ඇති බැවිනි. ඔබ ධර්මිෂ්ඨ භාවය තුළ වැඩෙන්නේ නම් එදා මා පැවසුවාක් මෙන් ඔබ මා කළ ක්‍රියා කරන්නේය; මටත් වඩා ප්‍රබල ක්‍රියා ඔබ කරන්නේය. ඒ ධර්මිෂ්ඨ භාවය පිළිබඳ විශේෂිත වූ ලක්ෂණයකි. ධර්මිෂ්ඨයෙක් යනු මගේ වචනයට කීකරු, මා යවන තැන ජීවත් වන, මා තුළ විශ්වාසය ජීවත් කරවන, සියල්ලන් උදෙසා පූජා වන, මගේ පියාණන්ගේ කැමැත්තෙහි ඇඹෙන, මගේ පියාණන් තුළ නිරන්තරයෙන් යැපෙන ජීවිතයකි. එමෙන්ම සියලු අසාර්ථකත්වයන් තුළ, පරුෂ ගැරහීම් හා විරෝධතාවයන් තුළ

ද නොසැලී පෙරට ම යාම ද ධර්මිෂ්ඨ භාවයේ ලක්ෂණයකි. මනස්ස්ථාපනයේ ජීවිතයත්, ධර්මිෂ්ඨ භාවයේ ගුණාංගත්, මගේ ජීවමාන වැඩසිටීම පිළිබඳ සාක්ෂි දැරීමත්, ඒ සඳහා ඔබගේ පූජා වීමත් කාලයේ අවශ්‍යතාවය බව මම ඔබට ප්‍රකාශ කරමි.

මේ ගමන අති බිහිසුණු ය. මේ ගමන යන්නෝ සැම විට ම සැම තැන ම පුදුමාකාර වේදනා විඳින්නෝය. ඔබගේ කඳුළු පිසදමන්නට වත් ඔබගේ දුකට කන්දෙන්නට වත් ඔබගේ අසල්වැසියා ඉදිරිපත් නොවනු ඇත. ඔබගේ ජීවිත ගමන මහා විනාශයක් කරා යන බව කියමින් ඔවුහු ඔබ උපහාසයට ලක් කරන්නෝය. එහෙත් මා තුළින් නික්මුණු මගේ දහම අද ලෝකය තුළ ජීවමාන වන්නේ ද, අද ලෝකයට මහත් බලපෑමක් කරන්නේ ද එවැනි ධර්මිෂ්ඨ ජීවිත බිහි වුවොත් පමණී. මම නැවත ද ඔබට කියමි. ධර්මිෂ්ඨ ජීවිතයක් කරා ඔබ වැඩෙන්නේ නම් මා කළාට ද වඩා ප්‍රබල ක්‍රියා ඔබ කරන්නෙහිය.''

## මෙම ප්‍රකාශනයට අදාල ව මැවුම්කරුවාණන් හෙවත් ධර්මයාණන් හෙවත් මිනිස් බව ගෙන මෙලොවට වැඩිය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ ව ඔබ විසින් අවබෝධ කර ගතයුතු සත්‍යතාවයන් බිඳක්.

* තමන් මැවූ ලෝකය දැහැමි තැනක් කරන්නට මැවුම්කරුවාණන්ට නොහැකි ද?

* එය දැහැමි ලොවක් කරනු සඳහා මැවුම්කරුවාණන් තම මැවීමක් වන මිනිසාගේ සහභාගිත්වය බලාපොරොත්තු වන්නේ ඇයි?

* මිනිසාගේ සහභාගිත්වයෙන් තොරව එය දැහැමි තැනක් කරන්නට එතුමන්ට නොහැකි ද?

* ලෝකයේ ගැළවීම උදෙසා තම ජනතාවගේ කැපවුන පරිත්‍යාගශීලි ජීවිත හා ඔවුන්ගේ යැදුම් නිරාහාරශීලිත්වයෙන් යුත් මොරගැසීම් එතුමන්ට අවශ්‍ය වන්නේ ඇයි?

* ධර්මයාණන් ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩියත් ලෝකය යහපත් තැනක් කරන්නට එතුමන්ට ද නොහැකි වී ද?

බොහෝ දෙනාගේ සිත් සතන් තුළ තවමත් නොවිසඳී ඇති ප්‍රශ්න කීපයකු යි, ඉහත සඳහන් කළේ. මෙම ප්‍රකාශනයේ අඩංගු මූලික සුපුවත අවබෝධ කර ගන්නට නම් මෙම ප්‍රශ්නවලට අපි නිසි පිළිතුරු ලැබිය යුතු වෙමු.

මැවුම්කරුවාණන් වන "**දෙවියන් වහන්සේ ප්‍රේමය යි.**" (**ශුද්ධ බයිබලය -1 ජුවාම් 4: 8**) ප්‍රේමය ඇති තැන මැවීමක් ඇත. එනිසා මේ මුළු විශ්වය දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ ගලා යාමකි. ප්‍රේමය විසින් ප්‍රේමය තුළ ප්‍රේමය උදෙසා සියල්ල මවා ඇත. මිනිසා ප්‍රේමය උදෙසා ජීවත් වන්නට තීරණයක් ගැනීමෙන් තම දිවියේ අරුත සොයා ගනී. මැවුම්කරුවාණන් අහසත් පොළොවත් මුළු විශ්වයත් මිනිසා ඇතුළු මුළු ජීවයත් මැවූ බව ශුද්ධ බයිබලය සඳහන් කරයි. මිහිමත මැවීමේ අති උත්තම මැවීම ලෙස මැවුම්කරුවාණෝ මිනිසා මැවූහ.

මිනිසාට ශරීරයක් ලැබිණ. එමගින් තම පසිඳුරන් තුළින් සොබා දහම හා එක් වන්නට ඔහුට හැකි විය. මනසක් හා බුද්ධියක් ලැබිණ. එමගින් සොබා දහම, තම පරිසරය නිසි කළමනාකරණයෙහි යොදවන්නට ඔහුට හැකි විය. ආත්මයක් හෙවත් මැවුම්කරුවාණන් කෙරෙහි සාගින්නක් පිපාසයක් ඔහුට ලැබිණ. එමගින් පෙනෙන සොබා දහම ඉක්මවා මනසට ද බුද්ධියට ද හසු නොවන උත්තරීතර අරමුණක් කරා වන්දනා ගමනක යෙදෙන්නට ඔහුට හැකි විය. හෘදය සාක්ෂියක් ලැබිණි. එමගින් හොඳ නරක හඳුනාගත හැකි විය. ඔහුට දූත මෙහෙයක් පැවරිණ. ඒ මැවුම්කරුවාණන්ගේ ස්වරූපය වන්නට, එතුමන්ගේ හොරණෑව වන්නට හෙවත් එතුමන්ගේ මහිමය උදෙසා දිවි ගෙවන්නට යි. එම අරමුණ උදෙසා ජීවත් වන්නට හෝ නොවන්නට එලෙස දේව මැවීම ඔසවන්නට හෝ එය අන්ත දින තත්ත්වයට ඇදදමන්නට එමගින් විමුක්තිය ලබන්නට හෝ විනාශ වන්නට ඔහුට දෙවිඳුන්ගෙන් නිදහස් කැමැත්ත ලැබිණ. මිහිමත මැවීම් අතරින් නිදහස්

කැමැත්ත ලැබී ඇත්තේ මිනිසාට පමණි. සමිඳාණෝ මිනිසාගේ විමුක්තිය උදෙසා සියල්ල කරති. එහෙත් ඒ සඳහා බල නොකරති. දෙවිඳුන් විසින් දුන් එම නිදහස මිනිසා විසින් ද සුරැකීම යි, මානව හිමිකම් සුරකීම යනු.

ධර්මයාණෝ මිනිසාට නිදහස් කැමැත්ත දෙන්නට තීරණය කළහ. ඒ ඇයි? “දෙවියන් වහන්සේ ප්‍රේමය යි.” එතුමන්ගේ ප්‍රේමයට ප්‍රති ප්‍රේමය දෙන මැවීමක් හැටියට යි, මිනිසා මවා ඇත්තේ. ප්‍රේමයේ ජීවිතයට නිදහස් කැමැත්ත තිබිය යුතු ම ය. එසේ නොවුනොත් එහි ඇත්තේ වහල් භාවය යි. මිනිසා මැවුම්කරුවාණන්ගේ හොරණෑව වෙනුවා වෙනුවට ඔහු තමාගේ ම හොරණෑව වන්නට තීරණය ගැනීමෙන් ඔහුගේ වැටීම සිදු විය. මිනිසාගේ යහපත මෙන් ම ඔහුගේ වැටීමේ විපාකය ද පරපුරින් පරපුරට ගලා යයි. මෙලෙස ලෝකයට ආත්මාර්ථය බිහි විය. ආත්මාර්ථය නිසා පාපය බිහි විය. පාපය නිසා ලෝකයට දුක වේදනාව බිහි විය. දෙවිඳුන් මැවූ ලෝකයේ ආත්මාර්ථය, පාපය, දුක වේදනාව නො වීය. ඒවා දෙවිඳුන්ට අකීකරු වූ මිනිසාගේ මැවීම් ය. මෙලෙස වැටුණු මැවීම නැවත මවන්නට සමිඳාණන් වහන්සේ කොපමණ මහත් දේ කළ සේක්දැ යි ශුද්ධවූ බයිබලය සාක්ෂි දරයි.

දෙවිඳුන් විසින් මිනිසාට නිදහස් කැමැත්ත දීම යනු තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදා ගැනීමකි. දෙවියන් වහන්සේ මිනිසා මවා ඔවුන් අමතා මෙලෙස පැවසීම ඉතා පැහැදිළි ව ම තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදා ගැනීමකි. **“නුඹලා බෝ වී වැඩි වෙමින් පොළව පූර්ණ කොට එය යටත් කර ගන්න.” (උත්පත්ති 1:28)** වගකීම අන් අය හා බෙදා ගැනීම මුහුකුරා ගිය ප්‍රේමය යි. වගකීම බෙදා ගතහොත් පමණි අනෙක් කෙනා උසස් වන්නේ. දෙවිඳුන් මිනිසාට නිදහස් කැමැත්ත දීමෙන් කළේ තම බලය බෙදා හැරීම යි, හෙවත් තම බලය විමධ්‍යගත කිරීම යි. එතුමන් විසින් කළ මෙම බලය බෙදා හැරීමට සමිඳාණෝ උපරිම ලෙස ගරු කරති. එය ඉක්මවා ක්‍රියා නොකරති. දෙවියන් වහන්සේ මිනිසාට නිදහස් කැමැත්ත දුන් මොහොතේ සිට ලෝකාන්තිමය දක්වා ලෝකය පූර්ණ කරන්නට මිනිසා දායක විය යුතු ම ය. ඒ සඳහා මනුෂ්‍යයකු සමිඳුන් සුරතේ මෙවලමක් වන තුරු සමිඳාණෝ බලා සිටිති. මිනිසාට ද සිය සවියෙන් පමණක් ලෝකය තුළ සදා පවතින සැබෑ උසස් වෙනසක් කිසි දා කළ නොහැකිය. ඒ සඳහා මනුෂ්‍යයා ධර්මයාණන් අත මෙවලමක් විය යුතු ම ය.

ලෝකාන්තිමය යනු නිදහස් කැමැත්ත දීමෙන් දෙවිඳුන් මිනිසා හා වගකීම බෙදා ගත් ලෝකය නැවත එතුමන්ගේ දෝතට මුළුමනින් ගන්නා මොහොත යි. එවිට ධර්මයාණෝ සිය සර්වබලධාරිත්වයෙන්, අපරිමිත තේජශ්‍රීයෙන් ප්‍රකාශ වෙමින් පරිපූර්ණත්‍ය උදා කරති. ලෝකය පූර්ණ කරන්නට දායක වී ද ලෝකය විනාශ කරන්නට දායක වී දැයි එදින සියල්ලෝ සමිඳාණන්ට පිළිතුරු දිය යුත්තාහ. විනිශ්චය යනු එය යි.

අද ලෝකයේ පවතින ව්‍යාකූලත්වය ගැන, මනුෂ්‍යත්වයේ මහා ගරා වැටීම ගැන සමිඳාණෝ මහත් මොරගැසීමෙන් යුතු ව ගාවිනා විඳිති. මහෝත්තමයාණන්ගේ සර්වබලධාරිත්වයට අනවශ්‍ය සියල්ල මොහොතින් සුං කොට සියල්ල මොහොතින් නවතාවයට පත්කළ හැකිය. එය පරම සත්‍යයකි. එහෙත් තම මැවීම පිළිබඳ වගකීම මිනිසා සමග බෙදා ගත් නිසා එම බලය බෙදා හැරීමට සමිඳුන් උපරිම ලෙස ගරු කරන නිසා සමිඳාණෝ ලෝකය වෙනස් කිරීම සඳහා කිසිවක් තනිව ම නොකරති. ඒ සඳහා යම් මනුෂ්‍යයකු සමිඳුන් අත මෙවලමක් වන තුරු එතුමාණෝ බලා සිටිති. “මම පිපාසා වෙමි” යනුවෙන් ජේසු සමිඳුන් පැවසූ වචනේ සැබෑ අරුත එය යි. “මා සනසන්නෙක් බලා සිටි නමුත් කිසිවකු හමු නො වීය.” යන ජේසු සමිඳුන්ගේ ප්‍රකාශනයේ අරුත එය යි. ඒ අනුව කිතුනු ජන වන්දනාවේ “ස්වාමිනි, අපි ඔබට සැනසීම දෙමු” යනුවෙන් පැවසේ. අපි සමිඳුන්ගේ සැනසීම පතා යදිමු. එතුමෝ අපට සැනසීම දෙති. එය සත්‍යයකි. එසේ ම මෙහි විස්තර කළ ධර්මයාණන්ගේ ක්‍රියාකාරීත්වයේ මෙම පැතිකඩ වැටහෙන කෙනෙකුට “ස්වාමිනි, අපි ඔබට සැනසීම දෙමු” අරුතේ ගැඹුර වැටහෙනු ඇත.

අද ලෝකය තුළ ධර්මයාණන්ගේ මහා මොරගැසීම හා එතුමන් විඳින මහා ගාවිනාව තේරුම් ගෙන (මනු කය ගෙන මෙලොවට වැඩිය ධර්මයාණන් වන ජේසු සමිඳුන්ගේ මෑණියන් වන මරිය තුමිය ද අද මිනිස් පවුලේ ගැළවීම සඳහා මහත් සේ මොරගසන්නීය.) යමකු සමිඳුන් සුරතේ අවියක් වෙමින් ප්‍රේමයේ පුදසුන මත තම දිවිය

යාගයක් මෙන් පුදන්නට සූදානම් නම් එලෙස ධර්මයාණන්ගේ සියලු කැඩීම් සහ ඇඹීම්වලට අග දක්වා ම ඉඩ දෙන්නට සූදානම් නම් එලෙස මිනිස් පවුලේ විමුක්තිය පතා මහෝත්තමයාණන් අබියස සහාය මැදිහත්කරුවන් වීමට සූදානම් නම් සම්ඳාණෝ මහත් සේ සොම්නස් වෙති. එලෙස යි එතුමන්ට සැනසීම දිය යුත්තේ. “මම පිපාස වෙමි.” සහ “මා සනසන්නෙක් බලා සිටි නමුත් කිසිවකු හමු නොවීය” යන මහා මොරගැසීම අවබෝධ වන තරමට යි ඔබගේ දූත මෙහෙය සඳහා කැපවීමත් ඒ කැපවීම සඳහා ඇවැසි මහා පන්නරයත් ජනිත වන්නේ.

මිනිස් පවුලේ ගැළවීම උදෙසා තම ජනතාවගේ යැදුම්, නිරාහාරය සහිත මොරගැසීම් එතුමන්ට අවශ්‍ය වන්නේ ඇයි? ධර්මයාණෝ පරම පරිපූර්ණත්වයේ ප්‍රතිමූර්තිය වන්නාහ. අප එතුමන්ට පැසසුම් දීමෙන් හෝ නොදීමෙන් එතුමන්ට එකතු වන හෝ එතුමන්ගෙන් අඩු වන කිසිවක් නැත. එහෙත් මහෝත්තමයාණන්ට පැසසුම් දීම මනුෂ්‍ය අපගේ පැත්තෙන් බලන විට “යුතුය, යෝග්‍යය, සාධාරණ ය, ගැළවීමදායක ය.” අපගෙන් හිස් වෙමින් මහෝත්තමයාණන්ට විවෘත වෙමින් එතුමන්ට පැසසුම් හා යැදුම් පුදන විට සැබවින්ම සිදු වන්නේ කුමක් ද? බලය වැඩි තැන ඇති මහා බලය එය අඩු තැනට ගලා ඒමකි. එය මුළු මැවීමට ගැළවීමදායක ය.

සමහරුන් සිතන්නාක් මෙන් මේ ලෝකය, මුළු මැවීම ම විකාරයක් හෝ මැවුම්කරුවාණන්ට හසුරුවා ගත නොහැකිව අයාලේ යන්නට අත්හැර දැමුවක් නො වේ. **“මම අල්ෆා ද ඔමෙගා ද වෙමි යි සිටින්නා වූ, සිටියා වූ, මතු සිටින්නා වූ සර්ව පරාක්‍රම වූ, ස්වාමි වූ දෙවියන් වහන්සේ කියන සේක.**” (**ශුද්ධ බයිබලය - එළිදරව් 1:8**) අල්ෆා හා ඔමෙගා යනු ග්‍රීක් හෝඩියේ මුල අකුර හා අග අකුර යි. එහි අරුත නම් දෙවියන් වහන්සේ ආරම්භය ද පරම අවසානය ද වෙති. එනිසා සියලු ගැටුම්, ව්‍යාකූලත්වය හා පසුබැසීම් තුළ ද ලෝකය ගමන් කරනුයේ ඔමෙගා මුදුන කරා ය. එය ශුභාරංචියකි. ධර්මයාණන්ගේ ක්‍රියාකාරිත්වය, නපුරාගේ ක්‍රියාකාරිත්වය ඒ සඳහා මනුෂ්‍යයාගේ සහභාගිත්වය තුළ යි, මුළු මැවීම ඔමෙගා කරා දෝලනය වන්නේ. ඒ උදාර අරමුණ සඳහා මනුෂ්‍යයාට ද ක්‍රියාකාරි දායකත්වයකට මහෝත්තමයාණන්ගේ ප්‍රේමය විසින් ඉඩ සලසා ඇත.

දෙවියන් වහන්සේ ප්‍රේමය බව ද මෙය ප්‍රේමය විසින් ප්‍රේමය උදෙසා කළ මැවීමක් බව ද මිනිසාට තම දිවියේ සැබෑ අරමුණ හමු වන්නේ ප්‍රේමය උදෙසා ජීවත් වන්නට තීරණයක් ගැනීම තුළින් බව ද මෙහි පෙර සඳහන් කළෙමු. ධර්මයාණෝ තම මැවීම සැලසුම් කර ඇත්තේ පරස්පර විරෝධි ක්‍රියාකාරිත්වය තුළින් ගොඩනැගෙන ව්‍යාකූලත්වය තුළින් ද ප්‍රේමය මහිමයට පත් වන මැවීමක් වශයෙනි. ධර්මයාණන්ගේ ක්‍රියාකාරිත්වයට ප්‍රති විරුද්ධ බලවේගයක් ඇත. ඒ යක්ෂයා ඇතුළු ඔහුගේ දූතයන් ය. දෙවිඳුන් විසින් නිදහස් කැමැත්ත ඇතිව උතුම් තත්ත්වයකින් මවනු ලැබූ දේව දූතයන්ගෙන් කොටසක් (ලුසිෆර් ඇතුළු පිරිස) අහංකාරය නිසා දෙවිඳුන්ට විරුද්ධව කැරළි ගැසීමෙන් සිදු වූ ඇදවැටීමකි, ඒ.

සාතන්, නපුරා, යක්ෂයා හෙවත් මෘගයා ඇතුළු ඔහුගේ දූතයෝ වෛරය මහිමයට පත්කරන්නට අධර්මය මහිමයට පත් කරන්නට ඇපකැප වී ක්‍රියා කරති. නපුරා ඇතුළු ඔහුගේ දූතයෝ දෙවියන් වහන්සේට ද අභියෝග කරති. උන්වහන්සේ ඒ අභියෝග භාර ගනිති. දෙවියන් වහන්සේ නපුරාගේ පැවැත්මට හා ඔහුගේ ක්‍රියාකාරීත්වයට මේ දක්වා ඉඩ දී ඇත. (මේ දක්වා යනුවෙන් සඳහන් කළේ දෙවිඳුන් විසින් නපුරා දහස් වසරකට බැඳ දැමීමක් ගැන ද ශුද්ධ වූ බයිබලයේ එළිදරව් පොතේ සඳහන් වන බැවිනි.)

ධර්මය හා අධර්මය අතර මහා යුද්ධයේ දී මනුෂ්‍යයා ධර්මයාණන් අත හෝ නපුරා අත මෙවලමක් විය යුතුය. ධර්මය හෝ අධර්මය යන දෙකෙන් එකක් තෝරාගත යුතුය. ධර්මයාණන් උදෙසා ජීවත් වන්නට එතුමන් අත මෙවලමක් වන්නට සූදානම් ව සිටින ජනතාව දෙවිඳුන් විසින් හඳුන්වන්නේ ‘මගේ කුඩා රැළ’ වශයෙනි. දෙවියන් වහන්සේ මිනිසා සමඟ බලය බෙදා ගැනීමක් සිදුකළ නිසා නපුරාගේ අභියෝගයට පිළිතුරු දීමේ දී ද එතුමාණෝ තනිවම ක්‍රියා නොකරති. ඒ සඳහා තම ‘කුඩා රැළේ’ සහභාගිත්වය බලාපොරොත්තු වෙති.

“මාගේ පියාණන් වහන්සේ කෙරෙන් නික්මුණු කිසිවකු විනාශ නොවනු සඳහා ඔවුන් උදෙසා යාච්ඤා කරන්න. නිරාහාරයෙන් යුතුව දෙව් පියාණන්ට මොරගසන්න.” යන ප්‍රකාශයේ අරුත එය යි. ප්‍රේමයේ පුදසුන මත අන් අයගේ විමුක්තිය උදෙසා තමා කැපකර ගනිමින් සමිඳුන් සුරතේ කැඩෙන ඇඹෙන ජීවිත හෙවත් ධර්මිෂ්ඨ ජීවිත සංඛ්‍යාව වැඩි වන තරමට ඔවුන්ගේ යැදුම් විශේෂයෙන් නිරාහාරය සහිත මොරගැසීම් වැඩි වන තරමට මහෝත්තමයාණන්ගේ ක්‍රියාකාරිත්වයට ඇවැසි පසුබිම සකස් වනු ඇත. සමිඳාණන් විසින් නපුරා වසර දහසකට බැඳ දමනු සඳහා ධර්මිෂ්ඨ ජීවිත හා ඔවුන්ගේ යැදුම් ඉතාමත් අවශ්‍යය මොහොත දැන් පැමිණ ඇත.

ධර්මය අධර්මය අතර මහා සටනේ දී නපුරාට වාසිදායක යැයි පෙනෙන කරුණු කීපයක් ඇත. නපුරා ලෞකිකත්වය පිළිබඳ සියල්ලේ අධිපතියා ලෙස හැඳින් වේ. ලෞකික භෞතික සියල්ල තුළින් මිනිසා ආකර්ෂණය කිරීමට නපුරාට ඇති ඉඩකඩ බොහෝ ය. මිනිස් මාංශය තුළ ද යහපතට වඩා අයහපතට වැඩි නැඹුරුවක් පවතී. ධර්මයාණෝ මිනිසාගේ නිදහස් කැමැත්තට ගරු කරති. නපුරා කිසිවකුගේ නිදහස් කැමැත්තට ගරු නොකරයි. දෙවිඳුන් ජීවිතයක දොරට තට්ටු කරනවා පමණි. ඒ හඬ අසා දොර ඇර එතුමන්ට ඇතුළු වන්නැ යි කෙනකු ඇරැයුම් කළොත් පමණි, එතුමා ජීවිතයට ඇතුළු වී එතුමන්ගේ ක්‍රියාකාරිත්වයට මුල පුරන්නේ. නපුරා ඇරුණු හිඩැසක් අතරින් හෝ ඇතුළු වී ඔහුගේ ක්‍රියාකාරිත්වයට මුල පුරයි.

ධර්මය අධර්මය අතර සටනේ දී ධර්මයාණන්ට ද වාසි දායක කරුණු කීපයක් කැපී පෙනේ. මිනිසාගේ ගැඹුරු ම අභ්‍යාන්තරයේ තම නිර්මාතෘවරයාණන් හැඳින ගන්නට පිපාසයක්, කුසගින්නක් එතුමන් විසින් ම තබා ඇත. දෙවියන් වහන්සේ සර්වබලධාරී වන සේක. නපුරාගේ බලය එයට අඩු බලයකි. මැවුම්කරුවාණන් වන සැබෑ එක ම දෙවිඳුන් හා සමාන වන්නට යක්ෂයාට කිසිම විටෙක කිසි ම ආකාරයකින් නොහැකිය. එවැන්නක් සඳහා ඔහුට බලය පැවරී නොමැත. නපුරාගේ බලය මනුෂ්‍යයින්ගේ බලයට වඩා වැඩි බලයකි. එහෙත් අධර්මය ප්‍රතික්ෂේප කරමින් ධර්මය අනුව ජීවත් වන්නට අවංකව කැමති වන මනුෂ්‍යයින් පිළිබඳ නපුරාට බලයක් නැත. ධර්මයාණන් වන ජේසුස් යන නාමයට සාක්ෂි දරන, එතුමන්ගේ දහම අනුව ජීවත් වන, ජේසුස් යන නාමය නිරන්තරයෙන් උච්චාරණය කරන මනුෂ්‍යයින් ඉදිරියේ නපුරා අන්ත දීන පරාජිතයෙකි. ධර්මයාණෝ ජේසුස් නමින් මනු කය ගෙන මෙලොවට පැමිණ මුළු මිනිස් සංහතියේ පාපය තමන් කෙරෙහි ගෙන එතුමෝ මුහුණ දුන් ආලෝකය හා අන්ධකාරය අතර මහා සටනින් නපුරා පරාජයේ අන්ත පරාජයට පත් කළහ. එනිසා නපුරා සදාතනික පරාජිතයෙකි. ජේසු සමිඳාණෝ සදාකාලික ජයග්‍රහකයාණෝ ය.

පාපි මිනිස් සංහතිය විමුක්තියට පත් කිරීම සඳහා ධර්මයාණන් ජේසුස් නමින් මිනිස් බව ගෙන මිනිස් කය තුළ සිටිය දී ද පාපයට මොහොතක් හෝ යට නො වී මුළු මිනිස් සංහතියේ පාපය ද තමන් කෙරෙහි ගෙන තම උත්තම පූජක දිවි පිදිම තුළින් ගැළවීමේ මිලය ගෙවිය යුතුව තිබිණ. එමගින් විමුක්තිය උදා විය. ගැළවීම ධර්මයාණන්ගෙන් ලැබෙන ත්‍යාගයකි. එම උරුමයට සහභාගි වීම හෝ නො වීම අප එකිනෙකා විසින් කළ යුතු කාර්යයකි. කිසිවකු හෝ ගැළවීමේ උරුමයට සහභාගි වනු දැකීමට නපුරා රිසි නො වෙයි. එය වැළැක්වීමට ඔහු සියල්ල කරයි. ධර්මයාණන් හා එක් වෙමින් එතුමන්ගෙන් ලැබෙන ගැළවීමේ ප්‍රීතිය අත්දකිමින් ධර්මිෂ්ඨ ජීවිතයට වැඩෙමින් ගැළවීමේ උරුමයට අන් අය ද සහභාගි වනු සඳහා කරන යැදුමෙන් හා මොරගැසීමෙන් සිදු වන ප්‍රතිපලය කුමක් ද? එය ගැළවීමේ උරුමය අත්දකින්නට බාධා කරන නපුරාගේ සියළු සැලසුම් සුණු විසුණු කරමින් ජේසු සමිඳුන්ගේ දිවි පිදීමෙන් උදා වූ ගැළවීමේ උරුමයට මිනිස් පවුල පමුණුවයි.

ධර්මයාණන් ජේසුස් නමින් මිනිස් බව ගෙන මෙලොවට වැඩියත් ලෝකය යහපත් තැනක් කරන්නට එතුමන්ට ද නොහැකි වී යැයි අපට කිව හැකි ද? කොහෙත්ම නැත. උන්වහන්සේ අල්ෆා ද ඔමෙගා ද වන සේක. ජේසු සමිඳාණන් මෙලොවට වැඩියේ අල්ෆා මට්ටමේ ක්‍රියාකාරිත්වයකින් මුල පුරමින් එයට තම ආත්මානුභාවය දානය කරමින් එය ඔමෙගා මුදුන දක්වා ගමන් කරන්නට ඇවැසි පන්නරය සපයනු සඳහා ය. ජේසුස් වහන්සේ සියල්ල එක වර පූර්ණත්වයට පත් කළ සේක් නම් අපට කරන්නට කිසිවක් ඉතිරි නො වනු ඇත. එය ද ප්‍රේමයේ දහමට පටහැනි ය. ඔබට ද මට ද කරන්නට කොටසක් ඉතිරි ව ඇත. එය කුමක් දැයි අපි තව දුරටත් අවබෝධ කර ගනිමු. එම

පිළිතුර දීම හෝ නොදීම අප එකිනෙකා සතු ය. අප විසින් දියයුතු පිළිතුර ධර්මිෂ්ඨ ජීවිතයක්, ශුද්ධවන්ත ජීවිතයක් හෙවත් සාධු චරිතයක් කරා වැඩීම යි. ඒ පිළිබඳ සම්‍යක් දෘෂ්ටික ලක්ෂණ සෑම ආගමක ම, සමහර දර්ශනවාද තුළ, උත්තම කලාව තුළ ගැබ්ව ඇත. දැන් අපි ඒ පිළිබඳ කෙටියෙන් හෝ විමසීමක යෙදෙමු.

## මෙම සම්‍යක්දෘෂ්ටිය පිළිබඳ කිතුනු දැක්ම

"දෙවියන් වහන්සේ ප්‍රේමය වන සේක." ශුද්ධවර පාවුලු තුමා දෙවියන් වහන්සේගේ ප්‍රේමය විස්තර කිරීමේ දී "ඊරොස්" යන ග්‍රීක් වචනය නො ව "අගපේ" යන වචනය යොදා ගෙන ඇත. ප්‍රේමය (Love) වචනය පිළිබඳ සමාජයේ මතුපිටින් සුලබව දකින අදහස යි, ඊරොස් වචනයේ ගැබ් වූයේ. ශුද්ධවර පාවුලු තුමා ඒ වචනය යොදා නොගත්තේ එබැවිනි. **ශුද්ධ වූ බයිබලය - 1 කොරින්ති 13: 1-13** "අගපේ ගීතය" ලෙස හැඳින් විය හැකිය.

**"මා මිනිසුන්ගේ ද දේව දූතයන්ගේ ද භාෂාවලින් කතා කරතත් ප්‍රේමය මට නැත්නම් මම ඝෝෂා කරන ඝණ්ඩාරයකට හෝ කටුක රාවය දෙන කයිතාලමකට හෝ සමාන වෙමි. දිවැසි වැකි දෙසීමේ වරම මට තිබුණත් සියලු අභිරහස් ගැන අවබෝධය ද සකල ඥානය ද මට ඇතත් කඳු සෙලවීමට තරම් බලවත් විශ්වාසයක් මට තිබුණත් ප්‍රේමය මට නැත්නම් මම හිස් තැනැත්තෙක්මි. දන් දීම සඳහා මා සතු සියල්ල වෙන් කළත්, මගේ සිරුර ගිනි පූජාවක් සඳහා බිළි දුන්නත් ප්‍රේමය මට නැත්නම් මට කිසි පලක් නැත. ප්‍රේමය ඉවසිලිවන්ත ය, කරුණාවන්ත ය. ප්‍රේමය ඊර්ෂ්‍යා වන්නේ නැත; පාරට්ටු කර ගන්නේ නැත; උඩඟු වන්නේ නැත. ප්‍රේමය අවිනීත නොවේ; ආත්මාර්ථකාමී නොවේ; හනික නොකිපේ; නපුර සිතේ ධාරණය කර නොගනියි; ප්‍රේමය අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවී හරි දේ ගැන ප්‍රීති වෙයි; ප්‍රේමය සියල්ල උසුලයි; ප්‍රේමයෙහි විශ්වාසයට ඉමක් නැත; බලාපොරොත්තුවට නිමක් නැත; ඉවසීමට අගක් නැත. ප්‍රේමය සදාතනික ය."**

ලෙබනන් ජාතික කවියකු හා දාර්ශනිකයකු වන **ඛලිල් ජිබ්රාන්ගේ The Prophet** (දිවැසිවරයා) පොතේ ප්‍රේමය පිළිබඳ අනගි නිර්මාණයක් දක්නට ඇත. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමයත් ඒ ප්‍රේමයෙහි ඇති මහා පවිත්‍රකරණයත් පිළිබඳ කිතුනු දැක්ම එහි කදිමට නිරූපනය වේ.

"එසේ නම් ප්‍රේමය ගැන කියන්නැ" යි අල්මිත්‍රා කීවාය. එකල්හී හෙතෙම හිස ඔසවා ජනයා දෙස නෙත් හෙළා බැලුවේය. නිශ්චලතාවයක් ඔවුන් වෙත පතිත විය. අනතුරුව මහා හඬකින් හේ මෙසේ කීවේය.

"ඔහුගේ මාර්ග දුෂ්කර ප්‍රපාත සහිත ඒවා වන නමුත් ප්‍රේමය ඔබට අත වනන විට ඔහු පසුපස යන්න. ඔහුගේ පියාපත් තුළ සැඟ වී ඇති කඩුවෙන් ඔබට තුවාල සිදු විය හැකි නමුත් ඔහුගේ පියාපත් තුළට ඔබ ගනු ලබන කල ඔහුට අවනත වන්න. උතුරු සුළඟ උද්‍යානය ආලපාළු කරන්නාක් මෙන් ඔහුගේ කටහඬින් ඔබගේ සිහින සිඳි වැනසී යා හැකි නමුත් ඔහු කතා කරන කල ඔහු කෙරෙහි විශ්වාසය තබන්න. මන්දයත්, ප්‍රේමය ඔබට ඔටුනු පළඳවන්නාක් මෙන් ම ඔහු ඔබ කුරුසියක ඇණ ගසනු ද ඇත. ඔහු ඔබගේ වැඩීම සඳහා වන්නාක් මෙන් ම ඔබගේ පාහිනු ලැබීම සඳහා ද වන්නේය. ඔහු ඔබගේ උස් ම තැනට ආරෝහණය වී හිරු එළියේ සැලෙන ලෙලෙන ළපටි ම අතු වැළඳ ගෙන සුරතල් කරන්නාක් මෙන් ම ඔබගේ මුල් වෙත ද අවරෝහණය වී ඒවා පොළොව බදාගෙන සිටීමෙන් සොලවා කම්පනය කොට දමන්නේය.

ධාන්‍ය කරල් එකතු කර ගන්නාක් මෙන් ඔහු ඔබ තමන් වෙතට එකතු කර ගන්නේය. ඔබ නග්න කරනු පිණිස ඔහු ඔබ පාහින්නේය. ඔබ දහයියා පොතුවලින් නිදහස් කරන පිණිස කුල්ලෙන් පොළන්නේය. ඔබ සුදෝ සුදු වන තෙක් ඔහු ඔබ අඹරන්නේය. ඔබ පහසුවෙන් නැමෙනසුලු කරන්නට හික්මවන්නට ඔහු ඔබ මනා ලෙස අනන්නේය. ඉන් අනතුරුව ඔබ දෙවියන් වහන්සේගේ ශුද්ධ මංගල්‍ය භෝජනයේ ශුද්ධ පූපය වන පිණිස ඔබ ඔහුගේ ශුද්ධ අග්නියට කැප කරනු ලබන්නේය. ඔබ ඔබගේ හදවතේ රහස් දැනගනු පිණිසත්, ඒ දැනුම කරණකොට ගෙන ජීවිතයාගේ හෘදයේ කුඩා කැබැල්ලක් වන පිණිසත්

ප්‍රේමය මේ සියලු දෙය නියත වශයෙන් ම ඔබට කරන්නේය. ඔබගේ බියපත් බව නිසා ඔබ ප්‍රේමයේ සාමය හා ආනන්දය පමණක් ම සොයන්නේ නම් ඔබ ඔබගේ නග්නත්වය වසාගෙන ධාන්‍ය පාහින කමතෙන් ඉවත් වී, සිනාසෙන නමුත් මුළු සිනාවම සෙන්නට නොහැකි, හඬා වැලපෙන නමුත් සියළුම කඳුළු සලන්නට නොහැකි ඒ ඍතු භේදයෙන් තොර ලෝකයට පලායන්න.

ප්‍රේමය අන් කිසිවක් දානය නොකරන්නේය; දානය කරන්නේ එය ම ය. එය කිසිවක් නොගන්නේය; ගන්නේ ද එයින් ම ය. ප්‍රේමය කිසිවක් හිමිකර ගන්නේ නැත; එය හිමිකර ගන්නට ද නොහැකිය. මන්දයත් ප්‍රේමය, ප්‍රේමය තුළම සෑහීමට පත්වන්නේය. ප්‍රේමයේ ගමන් මඟ මෙහෙය වන්නට ඔබට පුළුවනැ යි නොසිතන්න. මන්දයත්, ඔබ සුදුසු යැයි යෝග්‍ය යැයි දැන හැඳින ගතහොත් එය ඔබගේ ගමන් මඟ මෙහෙය වන බැවිනි. එය ම පූර්ණත්වයට පත්කර ගැනීමෙන් තොර අන් ආශාවක් එයට නැත්තේය. එහෙත් ඔබ ප්‍රේම කරන අතර ආශාවන් ද රැක ගන්නට උවමනා නම් මේවා ඔබේ ඒ ආශාවන් කර ගන්න. දිය වී රෑ අඳුරට තම ගීය ගයන ගලා බස්නා දොල පහරක් වීමට, අතිශය මෘදු භාවයේ වේදනාව දැන ගැනීමට, ප්‍රේමය පිළිබඳ ඔබගේ ම අවබෝධයෙන් තුවාල ලැබීමට, කැමැත්තෙන් හා ප්‍රීතියෙන් යුතුව රුධිර දානයට, හිමිදිරි පාන්දර පියාපත් විදහා ගත් හදවතකින් යුතුව අවදිව ප්‍රේමයේ තවත් දවසක් ගැන ස්තුති කියන්නට, ඉර මුදුන් වූ මද්දහන් පැයේ විශ්‍රාම ගෙන ප්‍රේමයේ අභිනන්දනය ගැන මෙනෙහි කිරීමට, සැඳෑ සමයේ ගොම්මන් වේලාවේ කෘතඥතා පූර්ණ හැඟීමෙන් පෙරළා ගෙදර බලා එන්නට, අනතුරුව ප්‍රේමවන්තයා වෙනුවෙන් ඔබගේ හද තුළ යැදුමක් හා තොල මත ප්‍රශංසා ගීයක් ඇතිව නිදා සැනසෙන්නට.”

දෙවියන් වහන්සේගේ ප්‍රේමය මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා ගුණ ඇතුළුව ඒ සියල්ල ද ඉක්මවා යන අසීමිත යථාර්ථයකි. සියල්ල මැව්වේ ද, පාපය තුළින් වැටුණු මැවීම නැවත මවන්නේ ද මැවීම දිනෙක පරිපූර්ණත්වයට පමුණුවන්නේ ද දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය විසිනි. එය කිතුනු දැක්ම යි. නිරන්තරයෙන් අප සොයා එන මහෝත්තමයාණන්ගේ ප්‍රේමය අදහමින් ඒ ප්‍රේමයට අප තුළ ක්‍රියා කරන්නට ඉඩ දීමයි, අපගේ කොටස. එම උරුමය ආශ්වාස කරන විට අප තුළින් නික්මෙන ප්‍රාශ්වාසයකි, යැදුම් හා පැසසුම්. ධර්මයාණන්ගේ ප්‍රේමය විශ්වාස නොකිරීමත්, එම ප්‍රේමයට තමා තුළ ක්‍රියා කරන්නට ඉඩ නොදීමත් අපගේ මූලික පාපය යි. දේව ප්‍රේමය එයට ඉඩ දෙන මනුෂ්‍යයා කෙරෙහි ක්‍රියා කරන්නේ කෙසේ දැයි **ශුද්ධ බයිබලය - එසකියෙල් 47: 1-9** මෙලෙස විස්තර කරයි.

**“ඔහු දේව මාලිගාවේ දොරකඩ ළඟට මා නැවත පැමිණෙව්වේය. එවිට දේව මාලිගාවේ එළිපත්තට යටින් නැගෙනහිර දෙසට වතුර ගලා යන බව මම දිටිමි. ඒ වතුර දේව මාලිගාවට දකුණු පැත්තෙන් පූජාසනයට දකුණෙන් එළිපත්ත යටින් ගලා ආවේය. එකල ඔහු මා උතුරු ද්වාර මණ්ඩපයෙන් පිටතට ගෙන ගොස් නැගෙනහිරට මුහුණපා තිබුණු පිටත දොරටුව ළගට වටකරීන් මා පැමිණෙව්වේය. එවිට වතුර දකුණු පැත්තෙන් වැගිරෙනු දිටිමි. ඔහු තමාගේ අතින් ලනුව රැගෙන නැගෙනහිර දෙසට යමින් මිටර් පන්සියයක් මැන්නේය. එවිට ඔහු මට වතුර මැදින් එගොඩට යන්න කිවේය. වතුර වළලුකර දක්වා තිබුණේය. ඔහු තව මිටර් පන්සියයක් මැන වතුර මැදින් මට යන්න කිවේය. වතුර දණහිස් දක්වා තිබුණේය. ඔහු තව මිටර් පන්සියයක් මැන වතුර මැදින් මා යැව්වේය. එතැන වතුර ඉඟටිය දක්වා තිබුණේය. ඔහු තව මිටර් පන්සියයක් මැන්නේය. එවිට එය මට බැස යන්නට බැරි ගඟක්ව තිබුණේය. මන්ද, බැස යන්නට බැරි ගඟක්ව පීනන්න වුවමනා තරමට වතුර ඉහළට නැග තිබුණේය. එවිට ඔහු කතා කරමින් මනුෂ්‍ය පුත්‍රය, නුඹ මෙය දුටුවෙහි දැයි මගෙන් අසා මා කැඳවා ගෙන නැවත ගං ඉවුරට පැමිණවිවේය.**

**මම හැරී ගිය කළ ගං ඉවුර දෙපැත්තෙන්ම බොහෝ ගස් තිබෙනු දිටිමි. ඔහු කතා කරමින් මේ වතුර නැගෙනහිර දිසාවට ගලා ගොස් අරබා සමභූමියට බැස ගොස් එහි මළ මුහුදට ඇතුළු වූ විට එහි ජලය මිරිදියට හැරුණේය. මේ ගංඟාව ගලා යන සෑම තැනම රාශි ගණන් පණ ඇති සියලුම සත්වයෝ ජීවත් වන්නෝය. මන්ද, මේ වතුර එහි පැමිණි විට අනෙක් ඒවා මිරිදිය වන්නේය. ගංඟාව ගලා යන කොතැනක වුව ද සිටින සියල්ලන් ජීවත්ව සිටිනු ඇත.”**

තම ප්‍රේමයේ ගැඹුරට වැඩි වැඩියෙන් පිවිසෙන ලෙස සමිඳාණෝ එයින් ඇරයුම් කරති. ඒ සඳහා එතුමාණෝ චක්‍රාකාර මාවත්වලින් අප ගෙන යති. එතුමන්ගේ ප්‍රේමය, ජීවිතයක් මුළුමනින් වෙනස් කරනු ඇත: කරදිය මිරිදිය කරන්නාක් මෙනි. මහෝත්තමයාණන්ගේ ප්‍රේමය අත්දකින ජීවිතය ගඟ ළග සිටුවන ලද, නිසි කල පල දරන ගසක් මෙනි.

## <u>ධර්මිෂ්ඨකම හෙවත් ශුද්ධවන්තභාවය - එයට මග</u>

"**ආබ්‍රහම් සමිඳාණන් වහන්සේ අදහා ගත්තේය. ඒ ඇදහිල්ල ඔහුගේ ධර්මිෂ්ඨකම වශයෙන් උන්වහන්සේ පිළිගත් සේක.**" (**උත්පත්ති 15:6, රෝම 4:3**) එනිසා ඒ ඇදහීමයි දේව ධර්මිෂ්ඨකමේ පදනම.

"**එබැවින් ඔවුහු කතා කොට දෙවියන් වහන්සේගේ <u>වැඩ</u> ඉෂ්ට කරන පිණිස අප විසින් කුමක් කටයුතු දැයි උන්වහන්සේගෙන් ඇසුවෝය. ජේසුස් වහන්සේ උත්තර දෙමින් දෙවියන් වහන්සේගේ <u>වැඩය</u> නම් උන්වහන්සේ විසින් එවූ තැනැත් වහන්සේ කෙරෙහි නුඹලා විසින් අදහා ගැනීමය යි කී සේක.**" (**ජුවාම් 6: 28,29** )

ඔවුහු සංකීර්ණත්වය දුටහ; දෙවිඳුන්ගේ නාමයෙන් කළ යුතු වැඩ ගොඩක් ඇති බව දුටහ. ක්‍රිස්තුස් වහන්සේ සංකීර්ණත්වය පමණක් නො ව මුළු සංකීර්ණත්වය නිරාකරණය කරන සරල නීතිය ද දුටහ. එය මිනිස් බව ගත් ධර්මයාණන් වන ජේසු සමිඳුන් අදහා ගැනීම යි, හෙවත් විශ්වාස කිරීම යි. එතුමන් අදහන තරමට එතුමන් හැඳින ගන්නට ක්‍රියා කරනු ඇත. ශුද්ධ බයිබලය ඇසුරෙන් පමණක් නො ව උත්ථාන වූ ජීවමාන සමිඳුන් හමුවෙමින් ඇසුරු කරමින් එතුමන් හඳුනා ගනු ඇත. එතුමන් හැඳින ගන්නා තරමට තම ආත්මාර්ථයට මැරෙමින් ක්‍රිස්තු ස්වරූපයට ඇඹෙන්නට රිසි වනු ඇත. එක ජීවිතයක හෝ එය උපරිමව සිදු වන විට දෙවිඳුන්ගේ වැඩ ඉටු වනු ඇත.

"**පළමුව දෙවි රජය සොයව්. එවිට සියල්ල දෙනු ලබන්නේය.**" **මතෙව් (6:33)** ධර්මයාණන් වන ජේසු සමිඳුන් අදහා ගැනීම, හැඳින ගැනීම, ක්‍රිස්තු ස්වරූපයට ඇඹීම, ඒ අරමුණ උදෙසා සාපිපාසාවක් ඇති වීම දේව රාජ්‍යය ම සෙවීමකි. ක්‍රිස්තු ස්වරූපයට ඇඹෙන්නේ කෙසේ ද? ඉංග්‍රිසි ගීතිකාවක මෙසේ සඳහන් වේ. (Break Me, Melt Me, Fill Me, Use Me) එම වදන් තුළ ඒ රහස ගැබ්ව ඇත. සමිඳුනි, මගේ මමත්වය කඩන්න, මමත්වයේ කැබලි ඔබගේ ප්‍රේමයේ බලයෙන් දියකර හරින්න, ඔබගේ දේව ආත්මයෙන් මා පුරවන්න, දේව ආත්මය මා තුළින් ප්‍රාශ්වාස වන තුරු. ඔබට ඇවැසි සේවාවෙහි මා යොදා ගන්න. නිදහස් කැමැත්තෙන් ම මේ සඳහා ඉදිරිපත් වන, අග දක්වා ම මැවුම්කරුවාණන් සුරතේ කැඩෙන ඇඹෙන ජීවිතයක් එතුමන්ට ඉතා ම අගනේය. මක්නිසාදයත්, එමගින් එතුමන්ගේ වැඩ ඉටු වන හෙයිනි.

දේශයේ හා මිනිස් පවුලේ විමුක්තිය උදෙසා ප්‍රේමයේ පුදසුන මත ඔබ යාගයක් මෙන් පිදෙන්නට සූදානම් වන්න. සමිඳාණන් කුඹල්කරුවාණන් හැටියට ඔබ එතුමන් සුරතේ මැටි පිඩක් වෙමින් එතුමන්ගේ සියලු කැඩීම් හා ඇඹීම්වලට අග දක්වාම ඉඩ දෙන්න. එවිට එය ධර්මිෂ්ඨ ජීවිතයකි. ඔබගේ දෙගුරුන්ට ඇවැසි ඔබ නො ව, ඔබට ඇවැසි ඔබ නොව, ඔබේ මැවුම්කරුවාණන්ට ඇවැසි ඔබ මතු වනුයේ එමගින් පමණකි. ඔබ කරන දේ ලෝකය වෙනස් නොකරයි. එහෙත් ධර්මයාණන් ඔබ තුළින් කර ගන්නා දේ ලෝකය වෙනස් කරයි; උසස් කරයි. මෙය මහා සත්‍යයකි.

## <u>ඉහත සඳහන් මෙම සත්‍යය වෙනත් වචනවලින් කතා කළ හැකිය.</u>

"**දෙවියන් වහන්සේගේ දවස පැමිණීම බලා සිට එය ඉක්මන් කිරීමට උත්සාහ කරන්න. ධර්මිෂ්ඨකම වාස භූමිය වූ නව අහසක් ද නව පොළොවක් ද දෙවියන් වහන්සේ අපට පොරොන්දු වී ඇත. අපි එය බලාපොරොත්තුවෙන් සිටිමු.**"

**(ශුද්ධ වූ බයිබලය - 2 ජේදුරු 3: 12,13)**

දෙවියන් වහන්සේගේ දවස පැමිණීම බලා සිට එය ඉක්මන් කිරීමට අප කළ යුතු මූලික දූත මෙහෙය වනුයේ ක්‍රිස්තු ශ්‍රාවකයින් බිහි කිරීම යි; හෙවත් ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීමට මරණයට හා උත්ථානයට (ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කුවට) ප්‍රබල ව සහභාගි වන ජනතාවක් ඇති කිරීම සඳහා අතදීම යි; ක්‍රිස්තු ශ්‍රාවක භාවයේ මිලය ගෙවන හෙවත් තමා සන්තක සියල්ල විකුණා ක්‍රිස්තුස් වහන්සේ නමැති මුතු ඇටය හිමි කර ගත් (**මතෙව් 13: 45, 46**) දේව ජනතාවක් ඇති කිරීමයි. ක්‍රිස්තු ශ්‍රාවක භාවයට ඇඹෙන්නකුට දේව පුත්‍ර භාවය මෙන්ම දුක් විඳින දාස භාවයට ඇඹෙන්නට සිදු වනු ඇත. එවැන්නකුට සමිඳුන්ගේ සියුම් මඟ පෙන්වීම වැටහේ; එනිසා සමිඳුන්ගෙන් ම ඉගෙන ගනියි; එවිට එතුමන් පෙන්වන මඟ ඔස්සේ යාමට එඩිතර වනු ඇත. යමෙක් ක්‍රිස්තු ශ්‍රාවක භාවයේ මිලය ගෙවන විට උන්වහන්සේගේ මරණයේ උත්ථානයේ බලය අද සමාජය වෙත පැමිණේ. එවිට ආධ්‍යාත්මිකත්වය මහිමයට පත් වූ සමාජයක් බිහි වනු ඇත.

“**මම ඔබ සමග වැඩ සිටිමි. මම ඔබට ප්‍රේම කරමි. මම කිසිසේත් ඔබගෙන් අහක්ව නොයමි. බිය නොවන්න, නොකැළඹෙන්න.**” සමිඳුන්ගේ මෙම පොරොන්දුව විශ්වාස කරන්නෝ විශ්වාසයේ ජනතාවගේ සංඛ්‍යාවට අයිති වෙති. ජීවිත ගමනෙ පුරා මෙම පොරොන්දුවෙහි රැඳී සිටින්න. සමිඳුන් ඔබ සමග වැඩ සිටින බව ඔබට ප්‍රේම කරන බව විශ්වාස කරන්නට බැරි තරම් සියල්ල අවුල් ජාලයක් වන විට ද එම පොරොන්දුවෙහි තදින් රැඳී සිටින්න. එය බලාපොරොත්තුවේ ගුණය යි. එම පොරොන්දුවෙහි රැඳී සිටින විට දේව ආත්මය ඔබ තුළ ක්‍රියා කරනු ඇත. එම පොරොන්දුවෙහි රැඳී සිටින තුරු නපුරාට ඔබ තුළ ඉඩක් නැත. එනිසා මෙම පොරෙන්දුවේ තරයේ රැඳී සිටිමින් සාර්ථකත්වයේ දී මෙන්ම අසාර්ථකත්වයේ දී ද දේව ක්‍රියාකාරිත්වය ම දකින්න. “ඔබ තුමන් මා සමඟ නම් මට ප්‍රේම කරනවා නම් ඇයි මෙය මෙලෙස සිදු වුනේ?” ජීවිත ගමන පුරා සමිඳුන්ගෙන් එලෙස විමසමින් පෙරට ම යන්න. එවිට සෑම ජීවිත සිද්ධියකින්ම ඔබට ලැබෙන්නේ ප්‍රඥාව යි. ජීවිත ගමන කෙලවර දක්වා ම ඒ මඟ යන්නේ නම් ඒ තුළින් බිහි වන්නේ ධර්මිෂ්ඨ ජීවිතයකි.

මනු කය ගෙන මෙලොවට වැඩිය ධර්මයාණන් වන ජේසුස් සමිඳුන් ඔබ දිවියේ ගැළවුම්කරුවාණන් හා එඬේරාණන් ලෙස භාර ගන්න. එවිට සමිඳාණෝ එතුමන් රිසි ලෙස ඔබ මෙහෙයවති. දිව්‍ය එඬේරා ඔබට උගන් වන්නේ ජීවිත සිද්ධි තුළිනි. එනිසා ඔබගේ ජීවිතයේ සිද්ධින්ට සංවේදි වෙමින් ඒ තුළින් එඬේරාණන් ඔබට දෙන ප්‍රඥාවෙන් සන්නද්ධ වන්න. සමිඳුන් හා යන ගමනේ දී ඔබ මුහුණ දෙන අමිහිරි සිද්ධියක් පවා දිව්‍ය එඬේරාණන් හා එක්ව ගැඹුරින් මෙනෙහි කරන විට ඔබට එයින් යම් ප්‍රඥාවක් ඉතිරි වේ. ඒ ප්‍රඥාව ලබා ගන්නට බල පෑ චරිතය ඔබට ඔබේ මිතුරකු, ගුරුවරයකු මෙන් දැනේ. එලෙස අනෙකා ගැන ඇති තිත්ත ගති අවසන් වේ. එඬේරා ඔබ ව තබන තැන සිටින්නට ද ඔබට කියන දේ කරන්නට ද ඔබ ඉගෙනගත යුතුය. එමගින් බිහි වන්නේ ද ධර්මිෂ්ඨ ජීවිතයකි.

ජේසු සමිඳාණෝ තමා වින්දා වූ දුක් වේදනාවල දී ද කනස්සල්ලට හෙවත් ස්ව අනුකම්පාවට යට නො වූහ. එම වේදනා දුක් විඳින අන් අය හා එකමුතු වීමට අවස්ථාවක් කර ගත්හ. එමගින් දුක් වේදනා ආශිර්වාදයක් හෙවත් අන් අය උත්ථාන කරන මාර්ගයක් කරගත්හ. ඔබගේ එදිනෙදා ජීවිතය තුළ ද ඔබගේ සාමාන්‍ය වැඩකටයුතු තුළ ද මෙම දැක්ම (විඳුම, පිදුම, මිදුම) ක්‍රියාවට නැගිය හැකිය. ඔබට විඳින්නට සිදු වන සෑම දේ අන්ත කටුක වේදනාවන් පවා සුබ සිතින් විඳ දරා ගන්න. ඒවා ජේසු සමිඳුන්ගේ කල්වාරී යාගය හා එක් කරමින් දිනපතා දෙවිඳුන්ට පුදන්න. මිනිස් පවුලේ මිදුම හෙවත් ගැළවීම උදෙසා ඔබගේ ජීවිත ගමන පුරා මෙම දැක්ම ක්‍රියාවට නගන්නේ නම් ඉන් බිහි වන්නේ ද ශුද්ධවන්ත ජීවිතයකි.

(ඉහත විස්තර කළ සියල්ල පාස්කුව (එතෙර වීම) පිළිබඳ දැක්මකි. ඔබගේ ජීවිත පාස්කුවට සාර්ථකව මුහුණ දෙන්නට නම් ක්‍රිස්තුස් වහන්සේගේ පාස්කුවේ උරුමය අත්දැකිය යුතුයි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ විමුක්තිදායක කුරුසිය තුළින් දෙවි පියාණන්ගේ ප්‍රේමයේ රාජ්‍යය අත්දකින, උන්වහන්සේගේ ශ්‍රී රුධිරයේ බලය තුළින් දෙවිපියාණන් හා එකිනෙකා හා සමගි වූ, එමගින් ඇති වන ඇතුලාන්ත නිහැඬියාව හා සාමය තුළ දෙවිඳුන්ගේ සියුම් මඟ පෙන්වීම අවබෝධ කර ගන්නා ජනතාවක් විය යුතුය.)

“මරියාවන්ගේ මව් පියෝ විශ්වාසයෙන් පූර්ණව ශුද්ධාත්මයෙන් පූර්ණව ඊශ්‍රායෙල්ට සැනසීම ලැබෙන්නේ යැයි නිසැක සිතින් බලා සිටියහ. ආලේලූයා” ජුලි 26 දිව්‍ය පූජාවේ දී අපි මෙම ප්‍රකාශනයට සවන් දෙන්නෙමු. එදා ඔවුහු දෙවිඳුන්ගේ ක්‍රියාකාරිත්වය සඳහා ඇවැසි පසුබිම් සංඝයක් වූයේ කෙසේ ද? 1. දෙවියන් වහන්සේ ගැන විශ්වාසයෙන් පූර්ණ ජනතාවක් වීමෙනි. 2. ශුද්ධාත්මානුභාවයෙන් පූර්ණ ජනතාවක් වීමෙනි. 3. දෙව් පියාණන්ට පූර්ණව අවනත වන සංඝයක් වීමෙනි. මහෝත්තමයාණන්ට අප විසින් කරන යැදුම්, පැසසුම් වචනයෙන් කරන ප්‍රශංසාවකි. මෙහි ඉහතින් පෙන් වූ කරුණු තුන ඔස්සේ ප්‍රායෝගිකව වැඩෙන ජීවිතය සමිඳුන්ට ක්‍රියාවෙන් කරන ප්‍රශංසාවකි. අපගේ වචනයෙන් කරන ප්‍රශංසාවට අරුතක් ලැබෙන්නේ ක්‍රියාවෙන් කරන ප්‍රශංසාවෙනි. අපිදු සමිඳුන් සුරතේ මෙවලමක් වන්නට නම් මෙහි සඳහන් කරුණු තුන ඔස්සේ වැඩෙන ජනතාවක් විය යුතු වෙමු.

ඉහත විස්තර කළ ආධ්‍යාත්මිකත්වය ඔස්සේ වැඩෙමින් සමිඳුන්ගේ උත්තරීතර සංඝය වෙමින් ආධ්‍යාත්මිකත්වයේ මහා අස්වනු නෙලනු සඳහා සමිඳුන් සුරතේ ප්‍රබල මෙවලමක් වන්නට අපට හැකි වූයේ යැයි සිතමු. අප යන මෙම ගමන පුරා ද විශේෂයෙන් ගමනාන්තයේ දී ද අප සිටිය යුතු ඉරියව්ව කුමක් ද? ලැබූ මුළු අස්වැන්න පිළිබඳ මහිමය සමිඳුන් සතු ය. ඉන් බිඳක් හෝ සොරා නොගන්නට අපි ප්‍රවේසම් විය යුත්තෙමු. එතුමන් විසින් අපට අණ කළ සියල්ල කළ පසු ජේසු සමිඳුන් අපට උපදෙස් වශයෙන් පැවසූ මෙම වදන් අපිදු ප්‍රතිරාවය කළ යුත්තෙමු. “**අපි දාසයෝ පමණක් වෙමු. ස්තුතියක් අපට හිමි නැත. ඔබ විසින් නියම කළ දෙය පමණක් අපි කළෙමු.**” **(ලූක් 17:10)** එසේම මිදි වත්තේ සේවයට අවසන් පැයේ දී පැමිණි සේවකයන්ට ලැබුන දිනාරයට වඩා වැඩි කිසිවක් අපි සදාතනයේ දී ද බලාපොරොත්තු නොවිය යුත්තෙමු. (**මතෙව් 20: 1-16**) ජේසු සමිඳාණෝ මෙසේ වදාළහ. “**ඔබ හැම අතර ඉතාම කුඩා තැනැත්තා ශ්‍රේෂ්ඨම තැනැත්තා ය.**” **(ලූක් 9:48)**

(මෙම කිතුනු දැක්ම වඩා පූර්ණ වීමට නම් දිව්‍ය සත්ප්‍රසාදය හා භාග්‍ය අට පිළිබඳ අපි කතා කළ යුතු වෙමු. එය අපගේ තුන් වන ප්‍රකාශනයේ දී සිදු වේ.)

## “රෝගීන්ට මිස නිරෝගීන්ට වෛද්‍යවරයකුගෙන් වැඩක් නැත” (මතෙව් 9:12)<br>තමා රෝගියෙක් බව පිළිගන්නා සුව වන්නට කැමති අයට යි,<br>ධර්මිෂ්ඨ ජීවිතයක් උදෙසා දිව්‍ය වෛද්‍යවරයාගෙන් ඇරැයුම්

“**ලෝකයා අගය කර සලකන දේ නැති කරනු පිණිස දෙවියන් වහන්සේ ලෝකයා පහත් කොට සලකන, හෙලා දකින, එමෙන්ම වැදගැන්මක් නැතැයි සලකන දේ තෝරා ගත් සේක. එසේ කළේ කිසිවකු දෙවියන් වහන්සේ ඉදිරියෙහි තමා පාරට්ටු කර නොගන්නා පිණිස ය.**” **(ශුද්ධ බයිබලය - 1 කොරින්ති 1: 28, 29)**

ශුද්ධවර පාවුලු තුමා ඒ තුළින් අපට අනාවරණය කරන දේව රාජ්‍යය පිළිබඳ රහස කුමක් ද? එතුමා සඳහන් කරන ඒ දුබලයන් කැඩීම් ඇඹීම් වැඩියෙන් ඇවැසි පුද්ගලයන් ය; හෙවත් ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීමට හා මරණයට වඩාත් සහභාගි විය යුතු චරිතයන් ය. කෙනකු තුළ ක්‍රිස්තුස් වහන්සේගේ දුක් විඳීමේ හා මරණයේ ප්‍රකාශනය වැඩි තරමට උත්ථානයේ ප්‍රකාශනය ද ප්‍රබල ය. එවැන්නන් තුළින් සමිඳුන් කොපමණ ප්‍රබල දේ කර ගත්තත් ඔවුහු තමන් ගැන පාරට්ටු කර නොගනිති. මක්නිසාද, ඔවුන් දුබලයන් බව ඔවුන් හොඳින් දන්නා බැවිනි. එතරම් කැඩීම් අවශ්‍ය නො වන දේව දීමනාවක් වශයෙන් යහපත් ගති බහුල ව ලැබී ඇති අයට ද තමන් ගැන පුරසාරම් දෙඩීමට නොහැකි වනු ඇත. මක්නිසාදයත් දෙවිඳුන් වඩාත් උතුම් දෙයට තෝරාගෙන ඇත්තේ ඔවුන් නො ව ඔවුන්ගේ ඇගැයීම් අනුව දුබලයන් ලෙස ඔවුන් දකිනා අය වන බැවිනි. එනිසා කිසිවකුට තමන් ගැන පාරට්ටුකර ගැනීමට නොහැකි වේ. සියල්ලන්ට ම දෙවිඳුන් ගැන පාරට්ටු කිරීමට සිදු වේ.

# ධර්මිෂ්ඨකම හෙවත් ශුද්ධවන්ත භාවය - එයට වැඩෙන්නට තවත් උපදෙස් ස්වල්පයක්

පෞද්ගලික විමුක්තිය පිළිබඳ දැක්ම මමත්වය හා බැඳුනකි. කිතු දහමේ ඇගැයීමට ලක් වනුයේ සමාජ විමුක්තිය හෙවත් පොදු විමුක්තිය පිළිබඳ දැක්ම යි. ජේසු සමිඳාණෝ මෙසේ වදාළහ. "**ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. තිරිඟු බීජය පොළොවෙහි වැටී නොමළොත් එය තනි බීජයක් පමණක් වේ. එහෙත් එය මළොත් සරු ලෙස පල දරයි. තම ජීවිතයට ඇලුම් වන්නා එය නැති කර ගනී.**" (**ජුවාම් 12: 24, 25**) "**යමෙක් මා අනුව එන්නට කැමැත්තේ ද ඔහු තම කම නසා දිනපතා කුරුසිය දරමින් මා අනුව ඒවා.**" (**මතෙව් 16:24**)

"**ඔබගේ එදිරිකාරයන්ට ඔබගේ නාමයේ මහිමය දක්වන පිණිස ද ඔබ ඉදිරියෙහි ජාතින් වෙවුලන පිණිස ද ඔබ තුමන් අහස පලාගෙන නොබසින්නේ මන්ද? එවිට කඳු ඔබ තුමන් දැක බියෙන් කම්පා වනු ඇත.**" **ශුද්ධ බයිබලයේ යෙසායා 64** සඳහන් කරන එම වචනවලින් ම සමිඳුන් අමතා මොරගසන්නට අවස්ථා අපට ද එළඹෙනු ඇත. අහස පලාගෙන පැමිණ හාස්කම් කරන්නට නො වෙයි එතුමන් රිසි වන්නේ. මිනිස් පවුල වෙනුවෙන් "පාප පූජාවක්" හැටියට සමිඳුන්ගේ සියලු කැඩීම් හා ඇඹීම්වලට අග දක්වා ඉඩ දෙන ජීවිතයක් සමිඳාණෝ සොයමින් සිටිති. එවැන්නකු හෝ එවැනි සංඝයක් එතුමන්ට හමු වුණොත් අහස පලාගෙන ඇවිත් කරනවාට ද වඩා ප්‍රබල දේ එතුමන් කරනු ඇත. සමිඳුන් සිය බලය වගුරන්නේ අග දක්වා ම එතුමන් සුරතේ කැඩෙන්නට ඇඹෙන්නට සූදානම් ජීවිත මත ය.

ධර්මිෂ්ඨ භාවයට හෙවත් ක්‍රිස්තු ශ්‍රාවක භාවයට ඇඹෙන්නා තුළ සමාජ ගවේශණය හා ආත්ම ගවේශණය අතර තුලයතාවයක් ඇති විය යුතුය. ආත්ම ගවේශණයෙන් තොර සමාජ ගවේශණය බිහිසුණු ඉරණමක් කරා මිනිසා යොමු කරනු ඇත. එවැන්නෝ මිනිසාගේ බුද්ධියට වඩා ආවේගයන්නට කතා කරති. එවැන්නෝ සියල්ලෙන් තමා වියවුල් වෙමින් අන් අය ද වියවුල් කරමින් හැසිරෙති. සමාජ ගවේශණයෙන් තොර ආත්ම ගවේශණය ද මෙම යුගයට නිසි පිළිතුර ගෙන ඒමට අපොහොසත් වනු ඇත. එනිසා ක්‍රිස්තු ශ්‍රාවක භාවයට ඇඹෙන්නා තුළ සමාජ ගවේශණය හා ආත්ම ගවේශණය අතර තුලයතාවයක් ඇති විය යුතුය. එයින් ලැබෙන අවබෝධය යි, නියම කැප වීමක් කරා, මමත්ව නිරුද්ධියක් කරා, ක්‍රිස්තු ස්වරූපයට ඇඹීමක් කරා ඔවුන් යොමු කරවන්නේ. ආත්ම ගවේශණය යනුවෙන් මෙහි දී අදහස් කළේ තමා තුළට (මනුෂ්‍යයා) ගැඹුරට යාම පමණක් නො ව, සමාජ ගවේශණය තුළින් රැස්කර ගන්නා දැනුම් සම්භාරය ධර්මයාණන් අබියස දී භාවනාව (යාච්ඤාව) නැමති කුල්ලෙන් හලා පොලා පලදායි දේ පමණක් එක්රැස් කර ගැනීම යි.

දේව රාජ්‍යය මනුෂ්‍යයා තුළ මනුෂ්‍යයින් අතර පවතින දෙයකි. ජේසු සමිඳාණෝ එසේ පැවසූහ. දේව රාජ්‍යය පිටත පුළුල් කරන්නට නම් දේව රාජ්‍යය තමා තුළ ගැඹුරු කරන්නට සමිඳුන්ට ඉඩ දිය යුතුය; හෙවත් තමා ගෙවී සමිඳුන් තමා තුළ වැඩෙන්නට ඉඩ දිය යුතුය. එවිට ජීවිත බඳුන පිරී පිටාරා ගලන්නට සමිඳුන් සලස්වනු ඇත. එවිට ප්‍රේමයේ දහම තුවාල නොකරමින් අන් අය වෙත දේව රාජ්‍යය පැමිණෙනු ඇත; හෙවත් සමාජය තුළ දේව රාජ්‍යය පුළුල් වනු ඇත. එය කෙතෙක් දිර්ඝ හා කටුක ගමනක් වුව ද වඩා පලදායි ධර්මදාන මඟ වනුයේ එය යි. (මෙහි ප්‍රේමයේ දහම තුවාල නොකරමින් යනුවෙන් සඳහන් කළේ අද ආගම් පැතිර වීමට ගන්නා උත්සාහයන්වල දී එවැන්නක් සිදු විය හැකි බැවිනි.)

"**දෙවියන් වහන්සේගේ ආත්මයාණන් විසින් ගෙන යනු ලබන යම් පමණ දෙනෙක් ඇද්ද එපමණ දෙනා දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය.**" (**ශුද්ධ බයිබලය - රෝම 8: 14**) සැබෑ කිතුනුවකු යනු තමා දෙවියන් වහන්සේගේ පුත්‍රයෙක් බව අත්දකින අයෙකි. දෙවියන් වහන්සේගේ පුත්‍රයකු බවට ඇති සහතිකය දේව ආත්මයාණන් විසින් මෙහෙයවනු ලැබීම, මඟ පෙන්වනු ලැබීම, ගෙනයනු ලැබීම, අත්දැකීම යි. ශුද්ධාත්ම මෙහෙය වීම අත්දකින ජීවිතයකට ඇතුළු වීමට නම් ආත්මය ධර්මයාණන්ගේ බලගතු ස්පර්ශයකට ලක් විය යුතු ව ඇත. එය **ශුද්ධ බයිබලයේ එපීස 4:30** විස්තර කරන්නේ "**ශුද්ධාත්මයාණන් තුළ මුද්‍රා කරනු ලැබීමක්**" වශයෙනි. (ජීව පද්මය විකසිත වීම, බුද්ධතාවය පිබිදීම බොහෝ දුරට

එම අදහස ම ප්‍රකාශ කිරීමකි.) අරමුණේ අවංකභාවය ඇත්නම්, අන් අයගේ විමුක්තිය උදෙසා ධර්මයාණන් සුරතේ කැඩෙන ඇඹෙන ජීවිතයකට අග දක්වා සූදානම් නම් ඒ ස්පර්ශය ලැබෙනු ඇත. මෙම අත්දැකීමට පිවිසීමත් සමග සෑම සිද්ධියක් තුළ සෑම ජීවිත තත්ත්වයක් තුළ ධර්මයාණන් දෙසට හැරෙන්නට - උත්සාහයෙන් නො ව නිරායාසයෙන් ම දෙවිඳුන් දෙස ම බලමින් එතුමන් තුළ ම යැපෙමින් එතුමන්ගෙන් ම උගනිමින් පෙරට ම යන්නට ලැබෙන ත්‍යාගයකි, එය. එමගින් ප්‍රඥා කාය වැඩෙනු ඇත.

ධර්මයාණන්ගෙන් ම උගෙනීමට නම් එතුමන් අබියස මැටි පිඩක් මෙන් නම්‍යව සිටිය යුතුය. යම් විෂය කරුණක් ගැන පොත-පතින් දේශන මගින් රැස්කර ගත් කරුණු පමණක් නො ව ඒ පිළිබඳ ඔබගේ ම මතය වුව ද තදින් අල්ලා නොගත යුතුය. ඔබ නිවැරදි යැයි සිතා සිටි බොහෝ දේ වැරදි ඇත. එනිසා ධර්මයාණන් පා මුල එලෙස නම්‍යව සිටින විට එතුමෝ ඔබට සියල්ල නිසි ලෙස උගන්වති. පක්ෂීන් සුළං තරංගය ඉදිරියේ පියාපත් විදහා ගෙන තමන් ගෙන යාමට ඉඩ දෙන්නාක් මෙන් අප ද තරයේ මිට මොලවාගෙන සිටින දෑත් ලිහිල් කරමින් ශුද්ධාත්මයාණන්ට අප ගෙන යන්නට ඉඩදිය යුතුය. ධර්මයාණෝ ඔබට එක පියවරක් පමණක් පෙන්වති. ඔබ ඒ පියවර තැබුවොත් පමණක් ඊ ළඟ පියවර පෙන්වා දෙති. එනිසා ඒ ගමන් මඟ මනුෂ්‍ය ස්වභාවයට අභියෝගයකි, පටු මාවතට පිවිසීමකි. මෙවැනි ගමනකට පිවිස එහි කෙළවර දක්වා යාම වීර චාරිකාවකි. ප්‍රඥා කාය හෙවත් ආධ්‍යාත්ම කාය වැඩීම තුළින් ධර්මිෂ්ඨ ජීවිතයක් බිහි වීම එහි ප්‍රතිඵලය යි. ප්‍රඥා කාය වැඩෙන්නේ ආගම පිළිබඳ දැනීම් සම්භාරයකින් හිස පුරවා ගැනීමෙන් පමණක් නො ව ධර්මයාණන් (ධර්ම ඥානය) විසින් මෙහෙයවනු ලැබීමෙන් ඒ මෙහෙයවීමට අවනත වීමෙන්, එතුමන් විසින් ම උගන්වනු ලැබීමෙනි.

හරි මඟ හා වැරදි මඟ ගැන අපි දනිමු. ආගමක් නොඅදහන්නෝ පවා මේ මාර්ග දෙක දකිති. ආගම් අදහන අය අතරින් ඉතා වැඩි දෙනෙක් ද මේ මාර්ග දෙක පමණක් දකිති. හරි මග යන්නට වැරදි මගෙන් ඉවත් වන්නට බොහෝ දෙනා උත්සාහ කරති. **රෝම 8:14** මුල් කරගෙන අප මෙතෙක් කතා කළ කරුණු ඔබට වැටහේ නම් හරි මඟට වඩා උත්තරීතර මඟක් ඇති බව ඔබට වැටහෙනු ඇත. ශුද්ධ බයිබලය තුළ විශේෂයෙන් සුවිශේෂ පොත් හතර තුළ (මතෙව්, මාක්, ලූක්, ජුවාම්) ඒ මඟ පැහැදිලි ව සටහන් ව ඇති නිසා එය සුවිශේෂ මාර්ගය හෙවත් ශුභාරංචි මාර්ගය (Gospel Way) ලෙස හැඳින්විය හැකිය. ධර්මයාණන් විසින් අප මෙහෙය වනු ලබන්නේ එම මාර්ගයේ ගමනක් සඳහා ය.

මිනිසාට කළ හැකි හා කළ යුතු දේ මත යැපෙන තත්ත්වය හරි මඟ හා වැරදි මඟ දෙකට ම පොදු ලක්ෂණයකි. සුවිශේෂ මාර්ගය අනුව සිදු වූ ක්‍රියාවක් නම් එය දෙවිඳුන් විසින් ම මුල පුරන ලද්දකි, බලවත් කරන ලද්දකි, පූර්ණ කරන ලද්දකි. සුවිශේෂ මඟ අපි යන්නට නම් සැමට පළමු දෙවිඳුන් අප ඉදිරියේ තබන එතුමන්ගේ ක්‍රියා හඳුනාගත යුතු වෙමු. හරි මඟ හා වැරදි මඟ අනුව කළ යුතුව ඇත්තේ මා විසින් තීරණය කරන දෙයයි. සුවිශේෂ මාර්ගයේ ගමන් කිරීම සඳහා සමිඳුන්ගේ මුල පිරීම අපි සියුම් අයුරින් හඳුනාගත යුතු වෙමු. දෙවිඳුන් අප ඉදිරියේ යම් වැඩක් තබා ඒ තුළින් ගමන් කරන්නට අපට අණ කළ විට අප තුළ හා අප තුළින් කළ නොහැක්ක කිරීමට එතුමෝ සූදානම්ව සිටිති.

සුවිශේෂ මාර්ගයේ කෙළවර දක්වා ගමන් කිරීම පිළිබඳ පරමාදර්ශය ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ය. දෙව් පියාණන්ට නිරන්තරයෙන් විවෘතව සිටිමින් පියාණන්ගේ කැමැත්ත හැඳින ගන්නටත් එම ගමන් මඟ කොතෙක් කටුක වුවද දිවි පරදුවට තබා හෝ එයට කීකරු වන්නටත් එතුමෝ ක්‍රියා කළහ. "**පියාණෙනි, මම ඔබගේ කැමැත්ත කරන්නට පැමිණ සිටිමි.**" එය ජේසු සමිඳුන්ගේ ජීවිතයේ තේමා ගීතය විය. තිස් තුන් අවුරුදු ජීවිතයක් තුළ ජේසු සමිඳුන් කළ එක ම දෙය නම් පියාණන් පෙන්වන ගමන් මඟ පියවරෙන් පියවර පෙරට ම යාම යි. තම පුතුණුවන්ගේ ඒ කීකරුකම තුළින් දෙව් පියාණෝ බොහෝ දේ සපුරා ගත්හ. ජේසු සමිඳාණෝ මෙසේ කීහ. "**ඉඳුරා ම මම ඔබට කියමි. පුත්‍රයාණන්ට කිසිවක් තනි බලයෙන් කළ නොහැකිය. ඔහුට කළ හැක්කේ පියාණන් වහන්සේ කරන බව තමන්ට පෙනෙන දේ පමණි.**" (**ජුවාම් 5:19**) පියා තමාට පෙරටුව තබන දේ හා එම මඟ සළකුණු හඳුනා ගෙන ඒ ඔස්සේ යාම පමණ යි, පුත්‍රයාට කළ හැක්කේ. එය යි, ශුභාරංචි මාර්ගය. ඒ අත්දැකීම යි ලෝකය නිදහස් කරන්නේ, ලෝකය උසස් කරන්නේ, ඒ අත්දැකීම යි, ශුද්ධවන්ත ජීවිතයක් බිහි කරන්නේ.

මේ සත්‍ය වෙනුවෙන්ම කැප වී ඒ කැප වීම තුළ අහිතව දිවි හිමියෙන් පෙරට ම ගමන් කරන්නෝ විශ්ව ආත්මයක අත්දැකීමට කැඳවීම ලබා සිටිති. ඔවුන් ලෝකයේ වටිනාකම් හා ඇගැයීම්වලට අනුගත නො වී ඒ අබියස අසම්මතයින් (පිටස්තරයන්) වනු ඇත. ඔවුහු තම සේවාව තුළින් පමණක් නො ව තම ජීවත් වීම තුළින් ම අස්වැන්න උපදවන්නෝ වෙති. එවැන්නෝ අනෙක් අයගේ වැරදි දකිමින් ඒවා විවේචනය කරමින් නොසිටිති. සියල්ලන් අතර වඩා දුබලයා තමා බව පිළිගනිති. ශුද්ධවර පාවුලු තුමා හා එක් ව ඔවුන් ද මෙලෙස කියනු නිසැක ය. "**ඔවුන් අතරින් ප්‍රධාන පව්කාරයා මම වෙමි. එසේ වී නමුත් මට දයාව දැක් වීමෙන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේගේ ඉවසීම සීමා රහිත බව උන්වහන්සේ පැහැදිළි කළ සේක.**" (1 **තිමති** 1:16) (මෙහි අසම්මතයා (පිටස්තරයා) වචනය යොදා ඇත්තේ කොලින් විල්සන්ගේ The Outsider පොතේ සඳහන් දැක්ම මුල් කරගෙන ය.)

"**මේ ලෝකයේ ප්‍රඥාව දෙවියන් වහන්සේ ඉදිරියෙහි මෝඩකමකි.**" (**ශුද්ධ බයිබලය** - 1 **කොරින්ති** 3:19) එසේ නම් දෙවියන් වහන්සේගේ ප්‍රඥාව මේ ලෝකයට මෝඩකමක් මෙන් පෙනෙනු ඇත. ලෝකයට මෝඩකමක් මෙන් පෙනෙන දෙවියන් වහන්සේගේ ප්‍රඥාවෙන් සන්නද්ධ වන තරමට යි ප්‍රඥාවන්තයෙක් (ධර්මිෂ්ඨයෙක්) බිහි වන්නේ. එවැන්නෙකු කරන කියන දේ තුළ බැලුබැල්මට පෙනෙන පරස්පරයක් ඇත. එහෙත් ඒ පරස්පරය ම එක හා සමාන සත්‍යයකි. බැලුබැල්මට පෙනෙන ඒ පරස්පරය යමෙක් තුළ නිරාකරණය වන්නේ දේව ආත්මයාණන්ගේ (ධර්මයාණන්ගේ) සියුම් මඟ පෙන්වීම තුළ පමණකි. පරම සත්‍යය විරුද්ධාභාෂි යථාර්ථයකි. (Paradoxical Reality)

ධර්මිෂ්ඨ ජීවිතයක් කරා වැඩෙන්නට ඔබ අවංක ව කැමති ද? ධර්මයාණෝ ඔබගෙන් ද එලෙස විමසති. එවැන්නක් සඳහා ඔබගේ කැමැත්ත ප්‍රකාශ කරමින් ඒ සඳහා ඔබ තුළ ක්‍රියා කරන්නට ඉඩ දෙන තරමට ධර්මයාණෝ ඒ ඉලක්කය කරා ඔබ ගෙන යති. සමිඳාණෝ දනිති, ඒ සඳහා ඔබ ගෙන යා යුතු මාවත. (එවැනි අරමුණක් කරා වැඩෙන්නට ඔබට හැකි ද කියා සමිඳුන් නොඅසන්නේ සැබවින් ම එවැන්නක් ඔබට නොහැකි බව එතුමන් දන්නා බැවිනි. එවැන්නක් ඔබට හැකි නම් එය ඔබගේ සීමා තුළ පවතින්නකි. එවැන්නක් ඔබට හැකි නම් ඒ සඳහා ධර්මයාණන් ඇවැසි නො වේ.) එනිසා සාර්ථකත්වය ම නො වෙයි, අවංක චේතනාව හා ඒ සඳහා මොරගැසීම යි ශුද්ධවන්ත භාවයේ පදනම. වැඩ ගොඩක් නො වෙයි, සමිඳුන් ඔබ කැඳවන තත්ත්වය තුළ ජීවත් වීම යි, ශුද්ධවන්තකම. ජේසු සමිඳාණෝ මෙසේ පවසති. "**අල්ප දේ ගැන විශ්වාසි තැනැත්තේ මහත් දේ ගැන විශ්වාසි වෙයි, අල්ප දේ ගැන වංචනික තැනැත්තේ මහත් දේ ගැනත් වංචනික වෙයි.**" (**ලූක්** 16:10) එනිසා එදිනෙදා ඔබගේ ඇඟේ හැපෙන වැඩ කොටස මහත් කැපවීමකින්, ගෞරවයකින් කරන්න. කුඩා ම දේ ගැන පවා ඔබ ඉතා විශ්වාසි බව දකින විට එතුමාණෝ ඔබ කැඳවූ ජීවිත තත්ත්වයෙහි ඔබ කෙමෙන් පිහිටුවති.

ප්‍රඥාව දෙවිඳුන්ගෙන් ලැබෙන තිළිණයකි. දහම අනුව දිවි ගෙවීමෙන් ධර්මයාණන්ගෙන් ම ලැබෙන ප්‍රඥාව ගැන ඉහත සඳහන් කළෙමු. ප්‍රඥාව ලැබෙන අනෙක් මාර්ගය උත්තම කලාව ඇසුරු කිරීමයි. උත්තම කලාවෙහි නියැලෙන කවියෙක්, කලාකරුවෙක්, සොබා දහමට නිශ්චලතාවයට සරල, අල්පේච්ඡ ජීවිතයට ඇලුම් කරයි. එම ගුණාංග හා ධර්මයාණන්ගේ සමීප බවක් ඇත. එවැන්නෙක් නිහැඬියාව තුළ සිත එක් තැන් කර ගනිද්දී ඔහුගේ ව්‍යවහාර ඥානය නො වෙයි පරම යථාර්ථය, විශ්ව මනස සතු ප්‍රඥාව යි, ඔහුගේ නිර්මාණය තුළට ගලා එන්නේ. උත්තම කලාකරුවකුගේ කලා නිර්මාණ තුළ සන්නිවේදනය සියුම් ය. මැවුම්කරුවාණන් වන ධර්මයාණෝ විශ්ව සෞන්දර්යයේ නිර්මාතෘවරයාණෝ ය. එතුමන් අප අමතන සංනිවේදනය අතිශයින්ම සියුම් ය. උත්තම කලාව තුළින් සියුම් මනසක් ඇතිකර ගන්නා තරමට ධර්මයාණන්ගේ සියුම් සන්නිවේදනය අපට වැටහෙනු ඇත. (උත්තම කලාව විශ්ව ආගමක් ලෙස සමහරු හඳුන්වති. එය සියුම් මනසක්, සංවේදි බවක් හෙවත් සුක්ෂ්මාත්මතාවයක් අප තුළ ඇති කරයි. ධර්මයාණන්ගේ අතිශයින් සියුම් සන්නිවේදනය හැඳිනගත හැක්කේ එවැනි මනසකට පමණි. මිනිසා සමිඳුන්ගේ සියුම් මග පෙන්වීම ඉදිරියේ අන්ධයින් බිහිරන් මෙන් හැසිරෙද්දී ප්‍රේමයේ නාමයෙන් එවැන්නන්ට ද තේරෙන, ගොරෝසු, දඩබ්බර බසකින් හෙවත් කුණාටු, භූමිකම්පා

ආදියෙන් පවා කතා කරන්නට එතුමන්ට සිදු වනු ඇත. එහෙත් එතුමන් රිසි වන්නේ එතුමන්ගේ සියුම් සන්නිවේදනයට අප සංවේදි ව සිටිනු දකින්නට ය.)

සමහරුන් දහම අනුව ජීවත් වීම නො ව දහම පිළිබඳ දැනීම් සම්භාරයක් පමණක් සොයමින් සිටින බවත්, සමහරුන් හාස්කම් සොයමින් සිටින බවත් සඳහන් කරන ශුද්ධවර පාවුලු තුමා **"එහෙත් අපි කුරුසියේ ඇණගසනු ලැබූ ක්‍රිස්තුස් වහන්සේ දේශනා කරමුව."** යනුවෙන් සඳහන් කරයි. (**1 කොරින්ති 1: 22, 23**) කුරුසිය මත යාගික වන ජේසු සමිඳුන්ගේ උත්තම පූජක දිවි පිදීම තුළින් නික්මෙන **ත්‍රිවිධ මරණයක්** වේ. **1. අයිතිවාසිකම්වලට මරණය (දුගී භාවය) 2. ආගාවන්ට මරණය (ව්‍රතශුද්ධිය හෙවත් පිරිසිදුකම) 3. තම කැමැත්තට මරණය (කීකරුකම)** මෙම ත්‍රිවිධ මරණය කැමැත්තෙන් වැළඳ ගන්නා ජීවිතයක් තුළින් පමණි, ධර්මිෂ්ඨ ජීවිතයක් බිහි වන්නේ. කෙනෙකුගේ ආධ්‍යාත්මික ගමනේ නිවැරදිතාවය මැන බැලිය හැකි එකම මිනුම් දණ්ඩ මේ ත්‍රිවිධ මරණය යි. ඔබ නිවැරදි ආධ්‍යාත්මිකත්වය ඔස්සේ ම වැඩෙන්නෙහි නම් එහි ගමනාන්තය දක්වා ම ඔබගේ කැමැත්තට මරණයක් තිබිය යුතුයි.

මිනිස් පවුලේ විමුක්තිය උදෙසා ධර්මයාණන් සුරතේ කැඩෙන ඇඹෙන ජීවිතයක් කිසි ම විටක ඒක පුද්ගල සංදර්ශනයක් නොවේ; එය සාංඝික ක්‍රියාවලියකි. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමයෙන් (ප්‍රේමයේ නාමයෙන්, ධර්මයේ නාමයෙන්) දෙදෙනකු හෝ තුන් දෙනකු එක්රැස් වන තැන එතුමන්, ධර්මයාණන් ප්‍රකාශ වන බව ජේසු සමිඳාණෝ වදාළහ. (**මතෙව් 18: 20**) එනිසා ධර්මිෂ්ඨ ජීවිතයක් කරා දැනට ම වැඩෙන්නකු හෝ එයට වැඩෙන්නට අවංක ලෙස සූදානම් අයකු සමග අතරින්පතර හෝ එක්ව ඒ පිළිබඳව කතා කිරීම වැදගත් ය. එවිට ධර්මයාණෝ ඔබ එකිනෙකා තුළින් ප්‍රකාශ වෙමින් එකිනෙකාට මග පෙන්වති.

ආධ්‍යාත්මිකත්වය පිළිබඳ කාර්යයෙහි ම නියැලෙන බොහෝ ජීවිත ඇතැ යි බැලුබැල්මට අපට පෙනේ. එහෙත් ආධ්‍යාත්මිකත්වයේ සැබෑ අස්වැනු නොපෙනේ. ඒ ඇයි? එමගින් තම කැමැත්ත පමණක් ඉටුකර ගන්නට ක්‍රියා කරන්නේ නම් එය ද මමත්වයකි. ආධ්‍යාත්මික බලය තුළින් තමාට කීර්ති නාමයක් සාදා ගන්නට හෝ හාස්කම් කරමින් ජනතාව තමා වටා රැස් කර ගන්නට රිසි වන්නේ නම් එය ද දැඩි ආත්මාර්ථයක් පමණකි.

## <u>ධර්මිෂ්ඨකම හෙවත් ශුද්ධවන්තභාවය - ඒ පිළිබඳ ජීවිත සාක්ෂි කිපයක්</u>

මනුෂ්‍යයා තුළ අපට පෙනෙන අයහපත් ක්‍රියා මෙන් ම යහපත් ක්‍රියා ද බොහෝ විට ආත්මාර්ථය නමැති උල්පතෙන් මතු වන්නකි. "ලෝකයේ සියල්ලන් සතුව ඇතැ යි අපට පෙනෙන යහපත්කම් සියල්ල එක් කළ විට දෙවියන් වහන්සේගේ අප්‍රමාණ යහපත්කම ඉදිරියේ ඒ සියල්ල දුෂ්ඨකමක් පමණි." යනුවෙන් කුරුසියේ සාන්ත ජුවාම් මුනි තුමා සඳහන් කළේ එබැවිනි. ඒ නිසා සැබෑ ආධ්‍යාත්මිකත්වය මමත්ව නිරුද්ධිය තුළින් හෙවත් ආත්මාර්ථයට මියගොස් අලුත් තත්ත්වයකට එසවීම තුළින් සිදු වන්නකි. ඒ නිසා අධ්‍යාත්මිකත්වය අරමුණු කරගන්නා මිනිසාට තමාගේ ම ශූන්‍යතාවය දෙසට ගමන් කරන්නට සිදු වනු ඇත. හෙවත් සමිඳාණෝ ඔබ ශූන්‍යතාවය දෙසට ගෙන යති. ඔබට ඇත්තේ ඒ සඳහා ඉඩ දීම යි. "මාගේ ශූන්‍යතාවයේ ගැඹුරට ම කිඳා බැසීමෙන් මා කොපමණ ඔසවනු ලැබීද යත් එමගින් මම මාගේ අභිප්‍රාය වෙත පැමිණියෙමි" යනුවෙන් කුරුසියේ සාන්ත ජුවාම් මුනි තුමා සඳහන් කරයි. (එතුමා විසින් ලියන ලද Ascent of Mount Carmal, Dark Night of the Soul යනාදි පොත්වල විස්තර වන්නේ ද ධර්මිෂ්ඨ ජීවිතයක් පිළිබඳ යථාර්ථය යි. එය ඉන්ද්‍රිය අන්ධකාර රාත්‍රිය හා අතීන්ද්‍රිය අන්ධකාර රාත්‍රිය පසු කර ආත්මයේ ගීතය යනුවෙන් එතුමා විස්තර කරන තත්ත්වයට පිවිසීම යි.)

මනුෂ්‍ය අභිමානය මුළුමනින් බිඳෙන්නට අවශ්‍යයි, ඔබ තුළ දේව අභිමානය මුළුමනින් ගොඩනැගෙන්නට. මනුෂ්‍ය අයිතිවාසිකම්වලින් මුළුමනින් හිස් විය යුතුයි, දේව අයිතිවාසිකම්වලින් පිරෙන්නට. ඔබ පිළිබඳ සමාජයේ ඇති ප්‍රතිරූප පමණක් නො ව ඔබ පිළිබඳ ඔබ තුළ ඇති ප්‍රතිරූප ද බිඳ වැටිය යුතුයි, ක්‍රිස්තු ස්වරූපය ඔබ තුළ

ඇඹෙන්නට. එනිසා සැබෑ ආධ්‍යාත්මිකත්වය කරා යන ගමන පටු මාවතේ කටු සහිත ගමනකි. **ලිසියුහි සාන්ත තෙරේසා තුමිය** මෙසේ සාක්ෂි දරන්නීය.

"මම දුර්වල අසරණ දරුවෙක්මි. එහෙත් ඔබගේ ප්‍රේමයේ යාගයක් ලෙස මාගේ ජේසුනි, ඔබ වහන්සේට මා පුද කරන්නට මා ධෛර්යවත් කළේ මාගේ එම දුර්වලකම ම ය. බොහෝ ඈත අතීතයේ සර්වබලධාරී දෙවියන් වහන්සේ විසින් බාරගනු ලැබූ සේක් පිරිසිඳු නොකැළැල් යාගයක් පමණි. දිව්‍ය සාධාරණකම ඉදිරියේ පිළිගැනුනේ නිර්දෝෂී යාගයක් පමණි. එහෙත් ප්‍රේමයේ ව්‍යවස්ථාව හිතියේ ව්‍යවස්ථාව වෙනුවට ක්‍රියාත්මක වී ඇත. මා වැනි දුර්වල අසම්පූර්ණ මැවිල්ලක් ප්‍රේමය විසින් යාගයක් ලෙස තෝරාගෙන ඇත. මා තෝරාගනු ලැබීම ප්‍රේමයට යෝග්‍යය ද? එසේය, මක්නිසාදයත් ප්‍රේමය පූර්ණ ව තෘප්තිමත් වන්නට නම් එය ශූන්‍යතාවයට කිඳා බැස එම ශූන්‍යතාවය ජීවමාන ප්‍රේමාග්නියක් බවට පත්කළ යුතුය. ස්වාමිනි, ප්‍රේමය පෙරලා ප්‍රේමයෙන් ගෙවිය යුතු බව මම දනිමි. ඉතින් මම මගේ හදවත බරෙන් හිස් කිරීමට මාර්ගය සොයා ගතිමි. එනම් ඔබගේ ප්‍රේමයට ප්‍රේමය දීම යි." (එතුමියගේ ආත්ම කතාව ඇසුරිනි.)

"මගේ ජීවිතයේ දී වැදගත් දෙයක් මා කර ඇත්නම් එය තර්ක බුද්ධියෙන් මා මෙහෙය වනු ලැබ කරන ලද්දක් නො වෙයි. එය මා තුළ ඇති සියුම් හඬ විසින් මා මෙහෙය වනු ලැබ කරන ලද්දකි" යි පවසන **මහත්මා ගාන්ධි** තුමා මෙසේ ද කියයි, "ආත්ම පාරිශුද්ධිය නමැති ආධ්‍යාත්මික ආයුධය නොපෙනෙන දෙයක් වුව ද අයකුගේ පරිසරය විප්ලවයකට ලක් කිරීමට හා බාහිර බාධාවන් නැති කිරීමට ඉතාමත් බලසම්පන්න මාර්ගය වේ. එය ඉතා සියුම්ව හා අදෘශ්‍යමාන ව ක්‍රියා කරයි. මෙය වෙහෙස කරවන සුළු කල් ගත වන ක්‍රියා පද්ධතියක් ලෙස පෙනුණත් ඉතා වේගවත් එකකි. මෙය නිදහස කරා දිවෙන ඉතා ම ස්ථිර වුත් ඉක්මන් වුත් සෘජු මාර්ගය වේ. ඒ සඳහා කරන කිසිම වෑයමක් විශාල වැඩි නො වෙයි. ඒ සඳහා අවශ්‍ය වන්නේ භක්තිය යි: මහමෙර සේ නොසැලෙන කිසිවක් නිසා පසුබට නො වන භක්තිය යි." (**ආචාර්ය ශ්‍රී ක්‍රිෂ්ණ ක්‍රිපලානිගේ "All Men Are Brothers" 'එක මවකගේ දරුවෝ'** ඇසුරිනි.)

"කැපවීම් කිසි විටෙක නිෂ්පල නොවන්නේය: කැපවීම් කිසි විටෙක ක්ෂණික ප්‍රතිපල ද නොගෙනෙන්නේය. යමෙක් යම් සත්‍යයක් වෙනුවෙන් කැප වී ඒ සත්‍යය අනුව ජීවත් වී ඒ සත්‍යය පාවා නොදීම නිසා දුක් විඳින්නට සිදු වේ නම්, සමහර විට මිය යන්නට පවා සිදු වේ නම් එම සත්‍යය ඊළඟ පරපුරේ උරුමය බවට පත් වේ. විකාශනයේ චක්‍රය යනු එයයි. විකාශනයේ චක්‍රය ක්‍රියාවට නැගෙන්නේ කැපවීමෙන් හා දුක් විඳීමෙන් පමණකි." **(සුභාෂ් චන්ද්‍රබෝස් තුමා)**

"යුක්තියේ දීප්තිමත් දිනය උදා වන තුරු ජාතියේ පවුරු පදනම් දෙදරවමින් කැරලි කුණාටු හමා යනු ඇත. ඒ එසේ නමුදු මේ අවස්ථාවේ දී මගේ ජනතාවට මා කිවයුතු කිසියම් කරුණක් වේ. යුක්තියේ මාලිගයට පිවිසෙන පියගැට පෙළ අබියස සිටින මගේ ජනතාවට මා කිවයුතු කිසියම් කරුණක් වේ. අපට ලැබිය යුතු සාධාරණ ස්ථානය දිනා ගැනීමේ ක්‍රියාවලියේ දී අපි පාපී ක්‍රියා සම්බන්ධයෙන් වැරදිකරුවෝ නො විය යුත්තෙමු. නිදහස සඳහා අපේ ඇති පිපාසය දැඩි දොම්නස හා වෛරය මගින් සංසිඳුවා ගැනීමට තැත් නොකළ යුතුව ඇත. නිර්මාණාත්මක ලෙස අප දක්වන විරෝධය ශාරීරික ප්‍රචණ්ඩ ක්‍රියා බවට පිරිහී යාමට ඉඩ නො තබමු. ශාරීරික බලයට ආධ්‍යාත්මික බලයෙන් පිළිතුරු දීමේ මහානුභාව සම්පන්න තේජස්වී තත්ත්වයට අපි යළිදු, යළි යළිදු නැගී සිටිය යුතු වෙමු. . . . ඔබ වනාහී නිර්මාණශීලිව වද වේදනා දැරීමේ ප්‍රවීණයෝ වෙති. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොර ව දුක් වේදනා දැරීම විමුක්තියට හේතු වන බව සිහියේ තබා ගනිමින් මේ කටයුත්ත නොකඩවා කරගෙන යන්න." (**මාටින් ලූතර් කිං** විසින් 1963 වොෂිංටන් නුවර දී පැවැත් වූ ලෝක ප්‍රසිද්ධ දේශනයෙන් කොටසකි.)

සමාජ විමුක්තිය වෙනුවෙන් තමා කැපකර ගැනීම තමා විනාශ කර ගැනීමක් ද? කොහෙත් ම නැත. එය තම ජීවිතයේ උපරිම පල නෙලා ගැනීමකි. **ශුද්ධ බයිබලය - උපදේශකයා 6: 23-31** ඊට කදිම සාක්ෂියකි. මෙහි ඇය යනුවෙන් සඳහන් වන්නේ දෙවියන් වහන්සේගේ ප්‍රඥාව යි.

**"මාගේ පුත්‍රය, සවන් දෙන්න; මාගේ අවවාදය පිළිගන්න.**

**ඔබේ පාද ඇගේ විලංගු තුළට දමන්න.**
**ඔබේ බෙල්ලට ඇගේ කරපටිය දමා ගන්න.**
**ඔබේ උරහිස ඇගේ වියගහට පාන්න.**
**ඇගේ තෝන් ලණු නිසා දුඟකාර නොවන්න.**
**ඔබේ මුළු සිතින් ඇට ප්‍රේම කරන්න.**
**ඔබේ මුළු ශක්තියෙන් ඇගේ මාවත අනුව යන්න.**
**ඇගේ පසුපස ගොස් ඇය සොයන්න.**
**ඇය ඔබට තමා එළිදරව් කරනු ඇත.**
**ඇය අල්ලා ගත් කල යන්නට නොහරින්න.**
**අන්තිමේ දි ඇය තුළ ඔබට ශක්තිය සම්බ වන්නේය.**
**ඔබ උදෙසා ඇය ප්‍රීතියට හැරෙන්නිය.**
**ඇගේ විලංගු ඔබට ශක්තිමත් ආරක්ෂාවක් වන්නේය.**
**ඇගේ වියගහ රන්මුවා අබරණක් වන්නේය.**
**ඇගේ තෝන් ලණු රත්නිල් පිත්ත පටි වන්නේය.**
**අලංකාර වස්ත්‍රයක් මෙන් ඔබ ඇය ඇඳගන්නෙහිය.**
**මහිමයේ කිරිටයක් මෙන් ඔබ ඇය පැළඳ ගන්නෙහිය.”**

## මෙම සම්‍යක්දෘෂ්ටිය පිළිබඳ දැක්ම - විවිධ ආගම් ඇසුරෙන්

මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ඛා මාවත ගැන අපේ අවධානය යොමු කරමු. මෛත්‍රිය යනු මනුෂ්‍යයා ඇතුළු සියලු සත්වයින්ගේ යහපත පිණිස පැතුරුණු බලවත් මනසක් ඇති වීම යි. කරුණාව යනු එය ක්‍රියාවට නැඟීමයි. යමෙක් මෛත්‍රී, කරුණා මාවතේ යන විට ප්‍රීති වන්නන් සමඟ ප්‍රීති වන්නටත් වැළපෙන්නන් සමඟ වැළපෙන්නටත් සිදු වේ. මුදිතාව යනු එයයි. යමෙක් මෛත්‍රී, කරුණා, මුදිතා මාවතේ පෙරට ම යන විට සමාජයෙන් වරදවා තේරුම් ගැනීම්, එනිසා නින්දා අපහාස ගල්-මුල් ලැබේ. ඒවාට ද මුහුණ දෙමින් පෙරට ම යන්නට එඩිතර වන්නෝ ඉතා ස්වල්ප දෙනෙකි. ගල් හා මඩ අතරින් පෙරට ම යන විට සමාජයෙන් ඔහුට පැසසුම් මල් පොකුරු ලැබේ. එතැන දී අහංකාරයට යට වී සමහරු ගමන මුළුමනින් නාස්ති කර ගනිති. ගල් හා මල්, ගැරහුම් හා පැසසුම් සම සිතින් භාර ගැනීම යි, උපේක්ඛා ගුණය. මෛත්‍රී, කරුණා, මුදිතා මාවතේ උපේක්ඛා ගුණය දක්වා වැඩෙන ජීවිතය සාධු චරිතයකි.

දාගැබක හා සඳකඩ පහණක පවා ආධ්‍යාත්මික්වය පිළිබඳ මහා දැක්මක් සාමාන්‍ය ජනතාවට පවා උරා-පෙරා ගත හැකි අයුරින් සංකේතාත්මකව ගැබ්කර ඇත. දාගැබේ ස්ථූලයෙන් ප්‍රකාශ කරන්නේ ලෞකිකත්වයේ, තෘෂ්ණාවේ ඇලි-ගැලි ඇති ජීවිතයකි. දාගැබේ බුබ්බුලාකාර (පෙණ බුබුලක හැඩය ගත්) කොටස අපගේ මෙලොව ජීවිතයත් මිනිසා ඇලුම් කරන ලෞකික සියල්ලත් පෙණ බුබුලක් මෙන් අනිත්‍ය බව ප්‍රකාශ කරයි. දාගැබක නිර්මාණය ක්ලේශයන් ප්‍රහීන කිරීම හෙවත් මමත්ව නිරුද්ධිය පිළිබඳ දැක්මකි. ධර්ම ඥානය ඔස්සේ මිනිසා අධ්‍යාත්මිකත්වය කරා වැඩෙන විට ඔහු ස්ථූලයෙන් සූක්ෂමයට ද සූක්ෂමයෙන් සූක්ෂමතරයට ද සූක්ෂමතරයෙන් සූක්ෂමතමයට ද ගමන් කළ යුතු බව ප්‍රකාශ කිරීමකි. සූක්ෂමතමය මාණික්‍යයකින් ප්‍රකාශ කරන්නේ එම අත්දැකීම කරා එක් අයකු හෝ පැමිණීම අනගිතම මැණිකකට ද වඩා අගනා බව ප්‍රකාශ කරන්නට නො වේද? සූක්ෂමතමයට පැමිණීමෙන් ඔහු අපරිමිත විශ්වය හා සදාතනය හා එක් වනු ඇත.

සඳකඩ පහණ ගැන **මහාචාර්ය සෙනරත් පරණවිතාන** සුරින්ගේ විග්‍රහය අධ්‍යයනය කරන විට එහි ගැබ් වන ආධ්‍යාත්මිකත්වය පිළිබඳ දැක්ම ඔබට පසක් වනු ඇත. ‘‘උවැසි උවැසියන් බුදුන් වැඳිමට පඩි පෙළ නඟින විට පළමුව පා තබනුයේ ගිනි දැල් මෙන් නිරූපිත (භවාග්නිය) සඳකඩ පහණෙහි අඩ කවයට ය. ඊළඟට පා තබනුයේ ජාති, ව්‍යාධි, ජරා, මරණ සංකේතවත් කරන ඇත්, අස්, සිහ, ගව රූප ඇති අඩ කවයටය. තුන් වන අඩ කවය සසරෙහි ඵල නැති බව නිරූපනය කරන ලිය වැළකින් යුක්තය. සතර වන අඩ කවය හංස වැලකින් යුක්ත වන්නේ සසරින් මිදි යන ප්‍රාඥයන් නිරූපනය කිරීමටය. මැද තිබෙන මඩෙන් නැඟී සිටින සේ නිරූපිත නෙළුම මගින් ප්‍රාණයන් සසරෙන් මිදි පිවිසෙන අවස්ථාව නිරූපනය කරයි.’’

(තම මනස ගුරුකොට ගෙන නොව "**ඔබගේ චේතනා අවංක නම් අදෘශ්‍යමාන බලවේග ඔබට උපකාරී වනු ඇත.**" යන සත්‍යය පෙරටුව තබාගෙන ආධ්‍යාත්මිකත්වය පිළිබඳ ගවේශණයෙහි යෙදීම වඩා පලදායි නො වේද? "**සියල්ලට වඩා සිත (මනස) රැවටිලිකාරව තිබේ**" යැයි **ශුද්ධ බයිබලය ජෙරමියා 17: 9** සඳහන් කරයි. ප්‍රඥා තොමෝ (ධර්මයාණෝ) ඇයගේ නිවහන කරගන්නට සුදුස්සකු ලොව කොහේ හෝ ඇද්දැ යි සොයමින් සිටිති. එවැන්නකු හමුවුණොත් ඇය ඔහු තුළ නිවහන්ගත වී ඇයගේ මුළු ප්‍රඥාව ඔහුට අනාවරණය කරන බව **ශුද්ධ බයිබලය - ප්‍රඥා 6: 16** සඳහන් කරයි. ප්‍රඥාවේ ආසනය වන්නට සුදුසු වන්නේ අරමුණේ අවංක භාවය ඇති මනුෂ්‍යයෙකි.)

**ඉන්ෂා - අල්ලාහ්** යනු දෙවියන් වහන්සේ කැමති නම් යන අරුත ප්‍රකාශ කරයි. යමෙක් දිවි ගමන පුරා තමා කරන කියන සියල්ලේ දී ධර්මයාණන්ගේ කැමැත්ත සොයමින් ඒ මෙහෙය වීම හඳුනා ගනිමින් දේව කැමැත්ත පමණක් ඉටු කරන්නට කැප වන්නේ නම් ඒ තුළින් ද නික්මෙන්නේ ධර්මිෂ්ඨ ජීවිතයකි.

## මෙම සම්‍යක්දෘෂ්ටිය පිළිබඳ දැක්ම - දර්ශනවාද හා විද්‍යාව ඇසුරෙන්

ක්‍රිස්තු පූර්ව 399 දී දිවි පිදූ ග්‍රීසියේ, ඇතැන්ස් හී විසූ **සොක්‍රටීස්** නම් ශ්‍රේෂ්ඨ දාර්ශනිකයා ගැන අපි අසා ඇත්තෙමු. එක මනුෂ්‍යයෙක් මුළුමනින් වෙනස් වුනොත් හෙවත් සම්පූර්ණයෙන් පවිත්‍රකරණයට ලක් වුණොත් ලෝකය වෙනස් වන බව, උසස් වන බව ඔහුගේ දැක්ම විය. එක් මිනිසෙක් වෙනස් වීමෙන් පලක් නො වන බවත් සියල්ලේ එකවර වෙනසක් සිදු විය යුතු බවත් සමකාලීන උගතුන්ගේ මතය විය. මෙම කරුණ අලලා සොක්‍රටීස් තුමා පිළිබඳ මෙවැනි පුවතක් අපි අසා ඇත්තෙමු. ඒ කතා පුවත මෙසේය. ඒ පිළිබඳ තමා හා තර්ක කරන උගතුන් කීප දෙනකු ඔහු හමුවට පැමිණි විට ඔහු ඔවුන් ඉදිරියේ ම ලෝක සිතියමක් කැබලිවලට ඉරා හැකි නම් ලෝක සිතියම නැවත සාදන්නැ යි කී බවත් එවිට ඔවුන් ඒ අභියෝගය භාර ගත් බවත් එහෙත් ඔවුන්ට එය කළ නොහැකි වූ බවත් ඒ අතර මිනිස් අතක පාදයක කොටස් ඔවුන්ට හමු වූ බවත් එසේ නම් ලෝක සිතියමේ අනෙක් පැත්තේ මිනිස් රුවක් ඇඳ තිබෙන්නට පුළුවනැ යි සිතා පහසුවෙන් මිනිස් රුව සකස් කළ බවත් ය. එවිට සොක්‍රටීස් ඔවුන් අමතා මේ අදහස කියා ඇත. "ඔබ ලෝකයක් හදන්න වෙහෙසුණා, එහෙත් එය ඔබට කළ නොහැකි වුණා. ඔබ එක මිනිසෙක් හැදුවා. බලන්න මෙහි අනෙක් පැත්ත. ලෝකය සැදී අවසන් ය." පූර්ණ විප්ලවය, ප්‍රේමයේ විප්ලවය කුමක්දැ යි මෙය අපට අනාවරණය කරයි.

**ආචාර්ය ඊ. ඩබ්ලියු. අදිකාරම් මහත්මා** දර්ශනවාදියෙකි. එතුමා '**සිතුවිලි**' පොත් ලියමින් 'සිතුවිලි' සමාජ ඇති කරමින් ජන මනස පුබුදුවන්නට ඇප-කැප වූහ. එතුමාගේ 'සිතුවිලි' පොත්වලින් උපුටා ගත් මෙම පාඨ අපට දෙන ආධ්‍යාත්මික පණිවුඩය මෙනෙහි කරන්න. "නරක මිනිසුන් බහුල ව සිටින සමාජයක හොඳ මිනිසකුට තැනක් තිබේද? එවැනි සමාජයකට හොඳ මිනිසකුගෙන් සිදු විය හැකි සේවය කුමක් ද? සමාජය විසින් හොඳ තැනැත්තා කොන්කර දමන්නට පුළුවන. එසේ නැති නම් ඒ තැනැත්තා නැතිකර දමන්න උත්සාහ කරන්නට පුළුවන. මනුෂ්‍යය ඉතිහාසයේ එවැනි අවස්ථා කොපමණ වත් දක්නට තිබේ. එහෙත් සමාජය විනාශයෙන් බේරෙන්නේ එවැනි හොඳ මිනිසකු, දෙදෙනකු නිසා ම බවත් ඉතිහාසයෙන් ම පෙනෙන්නට තිබේ.

හොඳ මිනිසා එක්තරා විදියක රික්තයකි, හෙවත් හිස් වූ තැනකි. ධනයට බලයට තත්ත්වයට ඇති ආශාවෙන් ඔහු හිස් වූවෙකි. අනුන්ට රිදවීමේ ආශාවක් ඔහු තුළ නැත. යම් සේ වාතයෙන් හිස් වූ තැන කුණාටුවක් මැවී අවට පරිසරය චංචල කරයි ද ඊට වඩා සියුම් එහෙත් ප්‍රබල ක්‍රමයකින් පරිසරයේ ලොකු වෙනසක් ඇතිකර වීමට හොඳ මිනිසා සමත් වන්නේය. එය ඔහුගෙන් සමාජයට නිරායාසයෙන් ම සිදු වන සේවය වේ. එක බුදුන් වහන්සේට, එක ජේසුස් වහන්සේට, එක සොක්‍රටීස් තුමාට මුළු සභ්‍යත්වයක් වෙන'තකට ගමන් කරවීමට හැකි වූයේ එම ශක්තියෙන් බැව් නිසැක ය."

"අපට පෙනෙන සහ නොපෙනෙන සැම ද්‍රව්‍යයක් ම සැදී තිබෙන්නේ පරමාණුවලින් ය. සැම පරමාණුවක ම ඇතුලේ විශාල ශක්ති ස්කන්ධයක් ඇහිරී පවතියි. පරමාණුවක් තුළට යමක් යවා ගත හැකි නම් එහි ආධාරයෙන් එම ශක්තිය පිටකරගත

හැකි වන්නේය. පරමාණුවක් ඇතුලට එසේ යැවිය හැකි එක ම දෙය වශයෙන් තිබෙන්නේ නියුට්‍රෝන් නම් ශක්ති අංශුව ය. නියුට්‍රෝනය පරමාණුවක තිබෙන ප්‍රධාන ශක්ති අංශු (ඉතා කුඩා කැබලි) තුන අතරින් එකකි. මෙහි දී අප බලාපොරොත්තු වන්නේ පරමාණුව ගැන වත් නියුට්‍රෝනය ගැන වත් විද්‍යාත්මක විස්තරයක් කිරීමට නො ව අපේ එදිනෙදා ජීවිතයෙහි දී අපට මුණ ගැසෙන ප්‍රශ්න සමහරක් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් වන එක්තරා ලක්ෂණයක් නියුට්‍රෝනයෙහි ද දක්නට ලැබෙන බැව් ප්‍රකාශ කිරීමට පමණ ය.

ඉලෙක්ට්‍රෝන්, ප්‍රෝටෝන් හා නියුට්‍රෝන් යනු පරමාණුවක ඇති ප්‍රධාන කොටස් තුන ය. එයින් ප්‍රෝටෝන් හා නියුට්‍රෝන් යන ශක්ති අංශු දෙවර්ගය පරමාණුවේ මැද තිබේ. ඉලෙක්ට්‍රෝන් සමූහයක් ඒ මදය වටේට අතිශයින් ම අධික වේගයකින් කරකැවේ. පරමාණුවක මැදට වෙන කිසිවක් යැවිය නොහැකි ව තිබෙන්නේ වටේ කරකැවෙන ඉලෙක්ට්‍රෝන්වල වේගය නිසාත් ඉලෙක්ට්‍රෝනය ඇලෙන සහ ගැටෙන  නිසාත් ය. පරමාණුව ඇතුලට යන හැකිව තිබෙන්නේ ඇලීමෙන් හා ගැටීමෙන් තොර වූ අංශුවක් වන නියුට්‍රෝනයට පමණි.  එහෙයින් ම පරමාණුව ඇතුලේ තිබෙන විශාල ශක්ති ස්කන්ධය මුදවා හැරීමට සමත් වන්නේ නියුට්‍රෝනය ය. (ඉලෙක්ට්‍රෝනය සෘණ විද්‍යුත් ආරෝපණයෙන් යුත් අංශුවකි. එහෙයින් පිටතින් පැමිණෙන සමාන ආරෝපණයෙන් යුත් සැම අංශුවක ම විකර්ෂණයත් අසමාන ආරෝපණයෙන් යුත් සැම අංශුවක ම ආකර්ෂණයත් ඉලෙක්ට්‍රෝනයෙන් කෙරෙයි. එසේ වූ විකර්ෂණයට හෝ ආකර්ෂණයට හෝ භාජන නො වන්නේ උදාසීනත්වයෙන් යුත් නියුට්‍රෝනයක් පමණ ය.") (ඇලීම් ගැටීම්වලින් තොර යන්නෙහි අරුත මමත්වය මුළුමනින් අවසන් කළ ජීවිතයකි. ක්‍රියාවාදයකට, වැඩ ගොඩකට යට වූ ලෝකය එවැන්නකු දකින්නේ උදාසීන අණුවක් ලෙස ය.)

## මෙම සම්‍යක්දෘෂ්ටිය පිළිබඳ දැක්ම - උත්තම කලාව ඇසුරෙන්

"**නුඹලා වෙනස් වී කුඩා දරුවන් මෙන් නොවුනොත් ස්වර්ග රාජ්‍යය දැකගත නොහැකියැ"යි** ක්‍රිස්තුස් වහන්සේ ප්‍රකාශ කළහ. එවැනි කුඩා දරුවන් තුළින් දිනෙක ඉදි වන නව ලොව **යෙසායා දිවැසිවරයා (11:6)** මෙසේ විස්තර කරයි. **"වෘකයා බැටළුවා සමග වාසය කරන්නේය. දිවියා එළු පැටවා සමග ලගින්නේය. වස්සා ද තරුණ සිංහයා ද එක් ව සිටින්නෝය. <u>කුඩා දරුවෙක් උන් ගෙන යන්නේය.</u>**"

අව්‍යාජ සරල නිර්මාණ තුළින් ගැඹුරු අනාවරණයන් (ප්‍රඥාව) ඉදිරිපත් කිරීම මහාකවි **රවීන්ද්‍රනාත් තාගෝර්**ගේ නිර්මාණ කලාවේ විශේෂ ලක්ෂණයකි. මෙහි ඇත්තේ එතුමාගේ '**The Crescent Moon**' (**අඩසඳ**) පොතෙන් උපුටා ගත් පාඨ කීපයකි. මෙයින් කියවෙන්නේ ශාරීරික කුඩා දරුවකු ගැන ම නොවේ. ඒ ඉහත සඳහන් බයිබල් පාඨයෙන් ඉදිරිපත් කරන ළදරුවා ම නො වේද? මෙයට කිඳා බැස එහි ප්‍රඥාව උරා බොන්න.

"මවගේ ළය මත හිස තබා සිටින්නට ඔහු ආශා කරයි. ඇයගේ දර්ශනය නොමැතිව සිටීම ඔහුට කිසි විටෙක උසුලන්නට බැරිය. නොයෙක් ආකාර පැහිච්ච වචන බබා දනියි. එහෙත් ඒවායේ අරුත තේරුම් ගැනීමට හැකි වන්නේ මේ මිහිපිට ටික දෙනෙකුටය. ඔහුට වුවමනා එක ම දෙය නම් මවගේ වචන ඉගෙන ගැනීම ය. එනිසයි ඔහු මෙතරම් අහිංසක ලෙස පෙනෙන්නේ. මැණියන්ගේ ප්‍රේමයේ වස්තුව සිඟන පිණිස යි, මේ කුඩා ආදරණීය නිරුවත් සිඟන්නා සම්පූර්ණයෙන් අසරණ බව හඟවන්නේ. ඔහුගේ මැණියන්ගේ හෘදයේ කුඩා මුල්ලේ ඔහුගේ සීමා රහිත ප්‍රීතියට තැනක් තිබෙන බව බබා දනියි. මවගේ ආදරණීය දෑතට අසු වී තද කර ගැනීම එම නිදහසට වඩා මිහිරි බව ඔහු දනියි. ඔහු ජීවත් වූයේ අතිශය ප්‍රීතිය ඇති රටෙහි ය.   . . ."

"ප්‍රේමයේ සුරතල් දෑත මෙන් මගේ මේ ගීය අවුත් සංගීතයෙන් ඔබ පුරවා ගනියි, මගේ දරුව. මගේ මේ ගීය ආශිර්වාදයේ හාදුවකින් මෙන් ඔබේ නළල්තලය ස්පර්ශ කරයි. ඔබ හුදෙකලාව සිටින විට එය ඔබ ළඟ වාඩි වී ඔබේ කනට කොඳුරනු ඇත. ඔබ පිරිස මැද සිටින විට එය ඔබ ඔවුන්ගෙන් වෙන් කර තබාගනු ඇත. අඳුරු රැය ඔබ යන මඟ වසාගෙන සිටින විට එය ඔබේ හිසට උඩින් ඇති විශ්වාසවත් තරුව මෙන් දිදුළනු

ඇත. මගේ ගීය ඔබේ ඇස්වල කළු ඉංගිරියාවේ හිඳ හැම දෙයක හදවතට ඔබේ දර්ශනය ගෙන යනු ඇත.''

''දූලියේ වැතිර ගෙන, කුඩා අතු රිකිල්ලක් අතින් ගෙන, දවස පුරා සෙල්ලම් කරන දරුව, ඔබේ සොම්නස කොතරම්ද? ඔය බිඳුණු රිකිලි සිහිත්තෙන් සෙල්ලම් කරන ඔබ දෙස බලා මම මඳහස පාන්නෙමි. දරුව, කෝටුකෑලි හා කොන්පිට්ටු අතරේ ගිලී හිඳිනා කල පවා මට නම් දැන් මතක නැති. දැන් මම අගනා කෙළිබඩු සොයන්නෙමි: රන් රිදී ගොඩවල් එකතු කරන්නෙමි. ඔබට ලැබෙන කොයි දෙයින් වුව ද ඔබ සෙල්ලම් කරයි. මම වනාහි කිසි ම දවසක මට ලබා ගත නොහැකි දෑ සෙවීමෙහි මගේ කාලයත් සවියත් වැය කරන්නෙමි.''

''අපේ මිහිකත උදෙසා දෙව් ලොව හාදුව දිනා ගත් මේ කුඩා හදවතට මේ පිරිසිඳු ආත්මයට ආශිර්වාද වේවා! හිරු එළියට ඔහු ප්‍රේම කරයි. සිය මවගේ මුහුණේ දර්ශනයට ඔහු ප්‍රේම කරයි. දූවිලි පිළිකුල් කිරීමටත් රත්තරන් ගැන එලවා යන්නටත් ඔහු ඉගෙන ගෙන නැත. ඔබේ හදවතට ඔහු තද කරගෙන ඔහුට ආශිර්වාද කරන්න. දහසක් හරස් පාරවල් ඇති මේ රටට ඔහු පැමිණ සිටී. ඔබේ දොර ළඟට අවුත් ඔබේ අත අල්ලා පාර ඇසීමට ඔහු මේ විශාල පිරිසෙන් ඔබ තෝරා ගත්තේ කෙසේ ද කියා මම නො දනිමි. පහළ දිය රැළි දරුණු වෙතත් ඉහළින් එන හුස්ම ටික අවුත් ඔහුගේ රුවල් පුරවා සමාදානයේ තොටුපල කරා ඔහු ගෙන යේවා! යි ඔහුගේ හිසට අත තබා යාච්ඤා කරන්න.''

''ඔවුහු කාලගෝට්ටි කරමින් දබර කරති: අනුමාන කරමින් කළකිරෙති. ඔවුන්ගේ ඇස දබරවලට අවසානයක් ඔවුහු නොදකිති. ඔබේ ජීවිතය පහන් දැල්ලක් මෙන් නොසැලී පිරිසිඳුව ඔවුන් අතරට අවුත් මගේ දරුව, ඔවුන් නිසල කරන පිණිස ප්‍රීති වන්න. ඔවුන්ගේ වචන ලේ පිපාසය ඇති පිහියා වැන්න. ක්‍රෝධයෙන් ඉපිලෙන ඔවුන්ගේ හදවත් අතරට ගොස් නැඟිට සිට මගේ දරුව, දවල් කාලයේ ඇති වන අඬදබර අවසානයේ සවස ඇති වන සමාදානයේ ක්ෂමාව වැනි ඔබේ සෞම්‍ය ඇස් ඔවුන් මත රඳවන්න. ඔබේ මුහුණ දැකීමට ඔවුන්ට ඉඩ දෙන්න. මගේ දරුව, එසේ කර හැම දෙයක ම අර්ථය වටහා ගන්න. ඔබට ප්‍රේම කර ඔවුනොවුන්ට ද ප්‍රේම කරන්නට ඔවුන්ට ඉඩ දෙන්න. එන්න මගේ දරුව, අනන්තයේ හදවත මත ඔබේ ආසනය ගන්න. අරුණෝදයේ පිපෙන මලක් මෙන් ඔබේ හෘදය විවෘත කර ඔසවන්න. සන්ධ්‍යාවේ ඔබේ හිස නමා නිශ්ශබ්දව දවසේ වන්දනාව සමාප්ත කරන්න.''

(මිනිස් ජීවිත දහම වෙතට දිනාගත හැක්කේ මෘදු භාවයෙන් සැරසුණු ළදරු ගතියට මිස රාජ බලයට හෝ ධන බලයට නො වේ. කවියා එය මෙලෙස ප්‍රකාශ කරයි.) ''ගල් අල්ලා ඇති පාර දිගේ මා උදයේ ඇවිදින විට මා කුලියට ගන්නැ'' යි මම කෑ ගැසුවෙමි. රජතුමා කඩුව අතේ ඇතිව වාහනයෙන් පැමිණියේය. ඔහු මගේ අත අල්ලා ''නුඹ මගේ රාජ බලයෙන් කුලියට ගන්නම්'' කියා කිවේය. ඔහුගේ රාජ බලය ප්‍රයෝජනවත් නො වීය. වක්ව වැටී ඇති පාර දිගේ මම ඒ මේ අත ගියෙමි. මහළු මිනිසෙක් ඔහුගේ රත්තරන් පොදිය රැගෙන ආවේය. ''මම මගේ මුදල්වලින් නුඹ කුලියට ගන්නම්'' කියා ඔහු කිවේය. එයින් ද පලක් නො වීය. සන්ධ්‍යාව විය. උයන මලින් බර වී තිබුණේය. සුකොමල තරුණියක් එළියට අවුත් ''මම නුඹ සිනහවකින් කුලියට ගන්නම්'' කිවාය. ඇයගේ සිනාව මිලාන වී ඇයගේ වත කඳුළින් තෙමුණේය. ඇය ආපසු හැරී හුදෙකලාව අඳුරට ගියාය. සූර්යයා වැලි මත දිළිසුණේය. ළදරුවෙක් මුහුදු බෙල්ලන් සමග සෙල්ලම් කරමින් සිටියේය. ඔහු හිස ඔසොවා මා අඳුනන බව හඟවා ''මම නුඹ නිකම් කුලියට ගන්නම්'' කියා කිවේය. එතැන් පටන් ළදරුවකුගේ ක්‍රීඩාවෙන් දැල්වුණු ඒ ගනුදෙනුව මා නිවහලකු කළේය.'' (''**අඩ සඳ**'' අනුවාදය - හෙට්ටිගේ බැස්ටියන්

## මෙය ඔබට කාලය යි.

**''මම කඳු මුදුන්වල ගංගා ද මිටියාවත් මැද උල්පත් ද විවර කරන්නෙමි. කාන්තාරය මැද දිය පොකුණක් ද වියළි දේශයෙන් උල්පත් ද ඇති කරන්නෙමි. සෙනඟ**

**මෙය දැක මහෝත්තමයාණන්ගේ හස්තය විසින් මෙය සිදුකළ බව දැන ගන්නෝය. සමිඳුන්ගේ තේජාලංකාරය ද එතුමන්ගේ මහා බල මහිමය ද සියල්ලෝ දකින්නෝය. බෙලහීන අත් බලවත්කර වෙව්ලන දණහිස් ශක්තිමත් කරන්න. බියසුළු සිත් ඇත්තන්ට මෙසේ කියන්න. බිය නොවී දිරිගන්න. දෙවිඳාණෝ ඔබ මුදන පිණිස ද අධර්මය සුණුවිසුණු කරන පිණිස ද වඩින සේක... කාන්තාරයේ ජලධාරා ගලා එන්නේය; මරු කතරෙන් ඇල දොල බිඳී එන්නේය.**''
**(යෙසායා 41:18,20 , 35: 2,3,4,6 )**

සමිඳාණෝ දිය උල්පත මවන්නට පෙර සියල්ල කාන්තාරයක් විය යුතුය. දැන් එය උපරිම තත්ත්වයෙන් සිදු වී තිබේ. අලුත් උතුම් බිහි වීමක් සඳහා ඇති ප්‍රසව වේදනාව බලවත්ය. ලෝකය ඇතුළු මුළු මැවීම ඔමෙගා හෙවත් පරිපූර්ණත්වයේ මුදුන කරා ගමන් කරමින් සිටී. මෙම අඳුරු පැයේ දී එය අප තුළ දිදුලන බලාපොරොත්තුවකි. ජගත් ප්‍රජාව මානව ඉතිහාසයේ ප්‍රබල ම මත ගැටුමට දැන් මැදි වී සිටී. මෙම ප්‍රකාශනය ඔබ වෙත ගෙන එන දැක්ම ඇතිව බලන විට මෙය නව උපතක ප්‍රසව වේදනාවක් පමණක් බව ඔබට පසක් වනු ඇත. එනිසා ''මෙය කාලයේ නරක ම කාලය යි; මෙය කාලයේ හොඳ ම කාලය යි.'' **චාල්ස් ඩිකන්ස්** ගේ එම වදන් ඉතා ම අදාල මොහොත මෙය යි.

පුද්ගලයා යනු විශ්වමය සමස්ථයේ අංශුවකි. සමස්ථය අංශුව කෙරෙහි බලපන්නා වූ ආකරයට ම අංශුවට ද සමස්ථය කෙරෙහි බලපෑ හැකිය. ඒ සත්‍යය අපි බොහෝ නිදසුන් ඇසුරෙන් කතා කළෙමු. පූර්ණ විප්ලවය, ප්‍රේමයේ විප්ලවය මෙය යි. ධර්මිෂ්ඨයින් දස දෙනකු ඇත්නම් සොදොම් ගොමෝරා නගර විනාශ නොකරන බව සමිඳාණෝ එදා පැවසූහ. (**ශුද්ධ බයිබලය - උත්පත්ති 18: 32**) ධර්මිෂ්ඨ යුගයක උදාව සඳහා වන මහා අරගලයේ දී ජීවිත විනාශය අවමය වනු සඳහා ධර්මිෂ්ඨ ජීවිත රැසක් බිහි විය යුතුය.

අද අප දේශය හා ලෝකය තුළ ඇත්තේ උගතුන්ගේ බුද්ධිමතුන්ගේ හිඟයක් නො ව ප්‍රඥාවන්තයිගේ හිඟයකි. ප්‍රඥාවන්තයින් බිහි වන මග මෙම ප්‍රකාශනයේ විස්තර කළෙමු. රටක් සමාජයක් අන්ත ප්‍රපාතයට වැටුණු විට එය නැවත ගොඩනගන්නට දායක විය හැක්කේ උගතුන්ට බුද්ධිමතුන්ට නො ව ප්‍රඥාවන්තයින්ට පමණකි. මිනිස් වර්ගයා තම සීමා තුළ කොපමණ සංවාද, තීරණ, ක්‍රියාමාර්ග ගත්ත ද ලෝකය මුහුණ දෙන ගැටළු, විෂමතාවයන් විසඳී නැත; ඒවා වඩා උග්‍ර වීම පමණයි, සිදු වෙමින් තිබෙන්නේ. මෙම ප්‍රකාශනය විසින් පෙන්වන ජීවිත ගමන් මඟට ඇතුළු වීමෙන් පමණයි, සැබෑ වෙනසක් සඳහා දායක විය හැක්කේ. ධර්මිෂ්ඨ ජීවිත හෙවත් සාධු චරිත සංඛ්‍යාව වැඩි වන විට ඉන් නික්මෙන ආධ්‍යාත්මිකත්වයෙන් පමණි, පුද්ගලයා හා ජාතින් තුළ සකේවුස් තුළ ඇති වූ වෙනස උදා කළ හැක්කේ. සකේවුස් ජේසු සමිඳාණන් අමතා මෙසේ කීවේය. ''**ස්වාමිනි, මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි. යමකුගෙන් අයුතු ලෙස යමක් ගෙන තිබේ නම් ඔහුට සතර ගුණයක් ආපසු දෙමි.**'' එවිට ජේසු සමිඳාණෝ මෙසේ කීහ. **''ගැළවීම අද මේ ගෙදරට පැමිණ ඇත.'' (ලූක් 19: 1-10)** මෙයට අඩු කිසිවක් සාධාරණ, බෙදා හදා ගන්නා ලෝකයක් සඳහා පිළිතුර නො වනු ඇත.

මානව ගැටළු විසඳීම සඳහා සරල ප්‍රතිචාරයන් දීමේ කාලය අවසන් ව ඇත; මහා ප්‍රතිචාරය ම දියයුතු මොහොත උදා වී ඇත. මහා ප්‍රතිචාරය නම් ධර්මිෂ්ඨ ජීවිත සංඛ්‍යාව වැඩි වීමයි. ආගම් විරෝධීන් ලෙස තමන් හඳුන්වා ගන්නා අයගෙන් බොහෝ දෙනෙක් ද තමන් දහම් විරෝධීන් ලෙස නොදකිති. එනිසා දහම් විරෝධීන් හැර ඕනෑ ම ආගමක් අදහන හෝ කිසිම ආගමක් නොඅදහන සියල්ලන්ට යි, මේ ඇරැයුම. දැහැමි යුගය උදා වනු සඳහා සැබෑ මනස්ස්ථාපනයක් තුළින් ධර්මිෂ්ඨ ජීවිතයක් හෙවත් සාධු චරිතයක් ඔබ තුළ පිළිසිඳ ගනිත්වා! ඒ සඳහා මේ ඔබට කාලය යි.

---

**ප්‍රකාශන - අංක 02**
**1999 නොවැම්බර්**
මෙම ප්‍රකාශනය පිළිබඳ වගකීම ''දහම් නවෝදය''